THE CHATHAM STREET JOURNAL
Trust your source. Trust your decisions. https://csj.lk/ 2023 | 08 | 27 Vol: 51

# ජනාධිපතිවරණය කඳවුරු දෙකක සටනක්





## සජිත්, ඩලස් පසුපස ඩලස්, අනුර පසුපස



P 02

## අත්නොහළ සිහිනයක බර අඩි තැබූ රැඩිකල් ලිබරල්වාදියා



P 04

## ඉන්දියානු විරෝධය ලාබෙට ගත් සටන් පාඨයක්



P 08

## උසස් අධ්‍යාපනයේ මීළඟ පිම්ම



P 09

## පාලකයාගේ අවිය ජනතාවගේ සවිය වන කාලයයි




## Brain Drain vs Brain Gain




## විපක්ෂය රට ගිනිතබා, රට භාරගන්නේ කුමකටද?

# අත්නොහළ සිහිනයක බර අඩි තැබූ

# රැඩිකල් ලිබරල්වාදියා

සාමාන්‍යයෙන් දේශපාලකයන් සමාජය ඉදිරියේ යමක් පවසන්නේ, තමන් කියන දේ හරහා තමන්ට අත්වෙන ලාභ පාඩු කිරාමැන ඉන් තමාට කිසිදු පාඩුවක් අවාසියක් නොවන බවට විශ්වාසයක් ඇත්නම් පමණි. උගත්කම්, බුද්ධිමත්කම්, තරාතිරම් වගේම හෘදසාක්ෂියේ ගුණයන් සියල්ල සිය දේශපාලන වාසිය වෙනුවෙන් මිස සමාජයේ උන්නතිය වෙනුවෙන් භාවිත නොකරන්නට ඔවුහු සැමවිටම පරිස්සම් වෙති. ඔවුනගේ පරිස්සම නිසාම බොහෝ විට සමාජයේ පැසසුම් ලබන්නෝද වෙති. එහෙත් තමන්ට අත්වන වාසි අවාසි නොතකා තමන්ගේම වූ වැඩපිළිවෙලක් දැක්මක්, හෙට රට ගැන සිහිනයක් සහිතව සමාජය ඉදිරියේ සත්‍ය පවසන්නන්ට, අනතුර පෙන්වන්නන්ට, මග කියන්නන්ට සැමවිටම හිමිවූයේ සමාජයේ ගැරහුම්ය. කෙණහිලිකම්ය. අවමානයන්ය.

එසේ සැමවිට ගැරහුමට, සමාජ අවමානයට ලක් වූ අපේ කාලයේ ප්‍රධාන පෙළේ දේශපාලකයන් දෙදෙනකු හඳුනාගත හැකිය. පළමුවැන්නා දිවංගත මංගල සමරවීරය. දෙවැන්නා අද මේ රටේ ජනාධිපති රනිල් වික්‍රමසිංහය. එහෙත් මේ දෙදෙනාගේම විශේෂය වූයේ, කවර බාධක පැමිණියත් රට පිළිබඳ තමන්ගේම වූ සිහිනය අත්නොහැර ඒකායන අරමුණකින් කටයුතු කිරීමය. එය සුමට සියුමැලි මාවතක් නොවුව ද එකී මාවතේ මංගලගේ විශේෂය වූයේ සිය ඉලක්කය වෙනුවෙන් බර අඩි තැබීමට දෙවරක් නොසිතීමය. මේ දෙදෙනා ගැන වරෙක වරුණ රාජපක්ෂ සමාජ මාධ්‍ය සටහනක් තබමින් පවසා තිබුණෙ, "**මංගල කියන්නේ ලංකාවේ අන්තිම රැඩිකල් ලිබරල්වාදියා, රනිල් කියන්නේ ලංකාවේ අන්තිම ක්ලැසිකල් ලිබරල්වාදියා**" කියාය. මෙකී කතාවේ සත්‍යතාවය විමසිය යුත්තේ, මංගලගේ මෙන්ම රනිල්ගේ ද දේශපාලන භාවිතාව ඇතුළේ මිස අනෙකෙකුගේ ඇසින් බලා නොවේ.



## රැඩිකල් ලිබරල්වාදියා

මංගල සමරවීර 1988 මාතර දිස්ත්‍රික්කයෙන් දේශපාලනයට අත්පොත් තැබුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙනි. නිදහස් පක්ෂය යනු ලංකා දේශපාලනයේ ජාතිවාදයට ආගම්වාදයට රාජ්‍ය මැදිහත්වීමක් හරහා නිල භාවයක් ලබාදුන් පක්ෂය බව දේශපාලනය ගැන උනන්දුවක් සහිත මෙරට ඕනෑම පුරවැසියකු දන්නා සත්‍යයකි. එපමණක් නොව පැරණි වැඩවසම් සමාජ ක්‍රමයන් තුළ ක්‍රියාත්මක වූ යල්පැනගිය සමාජ කුල, බල, ප්‍රභූ ධූරාවලි සිය දේශපාලන වැඩපිළිවෙල හරහා අලුත් වටයකින් සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු ලෙස සමාජය තුළ නැවත ස්ථාපිත කරමින් යල්පැනගිය වැඩවසම් සමාජ ධූරාවලිය යාවත්කාලීන කිරීමට කටයුතු කළ පක්ෂය ද විය. එවන් වූ අන්තගාමීත්වයකට නැකම් කී දේශපාලන පක්ෂයකින් සිය ගමන ඇරඹූ මංගල සමරවීර සිය දේශපාලන භාවිතාව තුළ ජාතිවාදයට විරුද්ධ, ආගම්වාදයට විරුද්ධ, ප්‍රජාතන්ත්‍රවාදයට පක්ෂ, යුද්ධයට විරුද්ධ, සාමයට පක්ෂ, එසේම නිදහස් වෙළඳපොල ආර්ථිකයට පක්ෂ, පුහු සමාජවාදයට විරුද්ධ, මානවවාදයට පක්ෂ ලිබරල්වාදියෙකු විය.

## ප්‍රජාතන්ත්‍රවාදයේ සිහිනය

සමාජවාදී හෝ වේවා ධනවාදී හෝ වේවා කවර දේශපාලන භාවිතාවක් නිසා හෝ බලකාමීන්ගේ රුදුරු සැහැසිකම් නිසා කිසිදු පුරවැසියකුගේ ජීවත්වීමේ පරම අයිතිය උදුරාගැනීමට කිසිවකුට අයිතියක් නොමැති බව විශ්වාස කළ මංගල ඊට එරෙහිව සටන් වැදුනේය. "**සියලු සත්වයෝ නිදුක් වෙත්වා නිරෝගී වෙත්වා සුවපත් වෙත්වා... යන්න තමයි ප්‍රජාතන්ත්‍රවාදය කියන්නෙ**" මංගලගේ ප්‍රජාතන්ත්‍රවාදී දැක්ම නිර්මාණය වුණේ එහෙමය.

1989 පාර්ලිමේන්තුවට පත්වූ නවක මන්ත්‍රීවරයකු ලෙස සිදු කළ මංගල කතාවේදීම, එවකට ජනාධිපති රණසිංහ ප්‍රේමදාසගේ දේශපාලන භාවිතාව දැඩිව විවේචනය කළේ ඒ නිසාය. එසේම සමාජ භීෂණයට, පුද්ගල අතුරුදන් කිරීම්වලට එරෙහිව 88-89 කාලයේ දිවි අහිමි වූවන් සොයා රටපුරා ඇවිද ගිය මව්වරු එකතු කොට "**මව්පෙරමුණ**" නිර්මාණය කරන්නේ ද ඒ වෙනුවෙනි. "**අහිංසකයන්ගේ ආරාමය**" වගේම මෑතක නිර්මාණය වූ "**අතුරුදන් වූවන්ගේ කාර්යාලය**" ද එහිම තවත් දිගුවකි.

එපමණක් නොව මේ රටේ මානව හිමිකම් සුරක්ෂිත කරනු පිණිස මංගල තැබූ ප්‍රජාතන්ත්‍රවාදී බරපතලම පියවර වූයේ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ගෙනෙන ලද ජිනීවා මානව හිමිකම් යෝජනාව හා එකඟවීමය. එය හුදෙක් පාවාදීමක් යැයි විරුද්ධවාදීහු පෙන්වා දුන්න ද සත්‍ය වශයෙන් ම එය එසේ නොවීය. මන්ද එවකට විදේශ කටයුතු අමාත්‍යවරයා වූ මංගල සමරවීර එකඟතාව පළමුව පවසා සිටියේ, "**ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් වගවීමට සිය ආණ්ඩුව සූදානම් බවත්, ඒ සඳහා අවශ්‍ය නෛතික හා විමර්ශන ආයතන ශ්‍රී ලංකාව තුළ ගොඩනගන බවත් ජාත්‍යන්තරයේ අත්දැකීම් හා උපදේශන පමණක් ඒ සඳහා පාදක කරගැනීමට කටයුතු කරන බවත්ය. එසේම ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා කිරීමට අවශ්‍ය මූලික පියවර රැසක් මේ වන විටත් ගනිමින් සිටින බවත් එම නිසා යුද අපරාධ සම්බන්ධයෙන් ජාත්‍යන්තර අධිකරණයක අවශ්‍යතාවයක් නොමැති බවය.**" එවන් වූ ගිවිසුම්ගත නොවීමක් එදා සිදුවූයේ නම් අදද ශ්‍රී ලංකාව ලෝකයෙන් හුදකලා වූ රටක් වනවා නොඅනුමානය.

## සාමයේ සිහිනය

එසේම ශ්‍රී ලාංකේය පුරවැසියන් වූ උතුරේ දෙමළ ජන කණ්ඩායමක් ද දකුණේ සිංහල ජනතාව ද දෙපසට බෙදී එකනෙකාට චෝදනා කරගනිමින්ද ගරහමින්ද අවි ඔසවා මිනිසුන් ඝාතනය කරමින්ද වසර ගණනාවක් පුරා රට තුළ යුදවාදී ගැටුමක නිරතව සිටි සමයක යුද්ධය එපා සාමය ගොඩනගමු යැයි දැඩි විශ්වාසයකින් මංගල කටයුතු කළේය. ඒ වෙනුවෙන් "**පොතයි - ගඩොලයි**" එක්තැන් කරමින් ඇරඹූ ගමනේ උච්චතම අවස්ථාව වූයේ "**සුදු නෙළුම් ව්‍යාපාරය**" නිර්මාණය කිරීම හරහාය. මෙරට ජාතිවාදීන්ගේ පරම සතුරා බවට මංගල පත්වන්නේ එතැන් සිටය. එහෙත් සිය උත්සාහය එල්.ටී.ටී.ඊ. සංවිධානය යුදමය වශයෙන් පරාජයට පත්කළ පසුබිමක "**අහන්න**" ඔස්සේ ද දියත් කළේය.

තවද මේ රටේ සාමයේ සිහිනයට අකුල් හෙළන කවරෙකුට වුවද මංගල විරුද්ධ විය. රටේ සාමය පිළිකෙව් කළ දේශපාලකයා ද බෞද්ධ පූජකයා ද ජාතිවාදියා ද ආගම්වාදියා ද වාමවාදියා ද යන්න මංගලට අදාළ නොවීය. ඔහු ඔවුන්ට එරෙහිව වැරෙන් පහර දුන්නේය. තක්කඩියා, චීවරධාරියා වගේම ජාතිවාදීයා, ළිංමැඩියා යැයි ඔවුන්ට ආමන්ත්‍රණය කිරීමට මංගල කටයුතු කළේ හුදෙක් පුද්ගලික වුවමනාව නිසා නොව රටේ අනාගතය සුබසිද්ධිය වෙනුවෙනි. එසේම "**මේ රට සිංහල බෞද්ධ රටක් නොවේ**" යැයි රටට හඬ ගා කිව්වේ ද මංගලය. ඒ අතිශය බිහිසුණු අයුරින් සිංහල බෞද්ධ කල්ලි කණ්ඩායම් සාහසික ලෙස සිය ප්‍රචණ්ඩත්වය රට පුරා වපුරමින් සිටි සමයකය.

එහෙත් මංගල සිය දිවියෙන් සමුගන්නා මොහොත දක්වා අත්නොහළ එකී සිහිනය සැබෑ නොවූවක්ව අදත් රට ඉදිරියේ ඉතිරිව ඇත්තේ රටේ අවාසනාවටය.

## සංවර්ධනයේ සිහිනය

මංගල පාර්ලිමේන්තු දේශපාලනය ආරම්භ කරමින් 1989 අප්‍රේල් මාසයේ සිය පළමු කතාව ඉදිරිපත් කරමින් එකල පැවැති සමාජ ප්‍රචණ්ඩත්වයට තදින් පහර ගැසුවා පමණක් නොව ශ්‍රී ලංකාවේ පළමු විධායක ජනාධිපති ජේ.ආර්. ජයවර්ධනයන්ගේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය අගය කිරීමට ද අමතක නොකළේය. "**සිරි ලක දේ සිරි සැපදේ**" යැයි අදහන පක්ෂයක සාමාජිකයෙකුව සිටිමින් විරුද්ධ පක්ෂයේ ආර්ථික දැක්ම අගය කිරීමට මංගලට හැකියාව තිබුණි.

මංගලගේ කතාව පමණක් නොව ක්‍රියාව ද විවෘත ආර්ථික ප්‍රතිපත්තියට සමපාත විය. මංගල තැපැල් හා විදුලි සංදේශ ඇමතිවරයාව සිටිය දී මෙරට සංනිවේදන ක්ෂේත්‍රයේ සුවිශේෂී වෙනස්කම් සිදු කිරීමට නොබියව පියවර තැබීය. මංගල එදා ටෙලිකොම් ආයතනය පෞද්ගලීකරණය කිරීමට පියවර ගත්තේය. දේශීය සම්පත් විදේශිකයන්ට විකුණනවා යැයි මරහඬ තැලූ විරුද්ධවාදීගේ ආර්ථික දැක්ම කෙතරම් පටු ද යන්න පෞද්ගලීකරණය වූ ටෙලිකොම් ආයතනයේ සාර්ථකත්වය හමුවේ සනාථ විය. මංගල ඔවුනට පිළිතුරු දුන්නේ බලලෝභීත්වයෙන් "**පොඩි ළිඳක ලොකු ගෙම්බෙකු**" වෙනවාට වඩා පුළුල් දැක්මකින් අධ්‍යනයකින් රටේ සංවර්ධන දිශානතිය විමසා බැලිය යුතු බවය. මංගල අන්ත ලිබරල්වාදියකු යැයි විරුද්ධවාදීහු චෝදනා කරමින් අවලාද නගද්දි මංගල කටයුතු කළේ නිදහස් ආර්ථික ක්‍රමයක් තුළ පීඩාවට පත්වන ජනතාවට සහන සලසන සුවිශේෂී ආරක්ෂණවාදී දැලක් සහිත ලිබරල්වාදයක් වෙනුවෙනි.

එපමණක් නොව අනාගත සංවර්ධන ඉලක්ක කරා යන ගමන වෙනුවෙන් වූ නීල හරිත ආර්ථිකයක් පදනම් කරගත් "**Vision 2025**" හරහා "ගම්පෙරළිය", "**Enterprise Sri Lanka**" වැනි ප්‍රායෝගික වැඩසටහන් තුළින් මහජනතාවට රටේ අනාගතය පිළිබඳ නැවුම් බලාපොරොත්තු දැල්වීමට මංගල සමත් විය. එහි පරම අධිෂ්ඨානය වූයේ මේ රටේ තරුණ තරුණියන් ව්‍යවසායකයින් බවට ගොඩනගා රටම ව්‍යවසායකයන්ගේ පාරාදීසයක් බවට පත්කිරීමය.

එසේම ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීමට නම් ප්‍රජාතන්ත්‍රවාදය, සංහිඳියාව නැමැති කුළුණු මත සංවර්ධනය ගොඩනැගිය යුතු යැයි තදින් විශ්වාස කළේය. එය රට වෙනුවෙන් අත්නොහළ ඔහුගේ සිහිනයම විය.

## සංස්කෘතික සිහිනය

ශ්‍රී ලාංකේය පොළොවේ ඉතිහාසයක් පුරා පැළ කර ඇති ප්‍රෞඪ සංස්කෘතික උරුමයන්ගෙන් රටේ ආනාගය වෙනුවෙන් සුරැකිය යුත්තේ කුමක් ද අත්හළ යුත්තේ කුමක් ද යන්න මනා අවබෝධයක් මංගල සතුවිය. ඒ අනුව මංගලටම වූ සුවිශේෂී සංස්කෘතික ගුණාංග ගණනාවක් විය. තමන් මන්ත්‍රීවරයෙක් ද අමාත්‍යවරයෙක් ද යන්න නොසලකා තමන්ට "මංගල" යැයි ආමන්ත්‍රණය කරන්න යැයි තමා ඉදිරියට එන ඕනෑම අයෙකුට අවසර දුන්නේ මංගලය.

"**මෙහි සර්ලා, මැඩම්ලා, අංකල්ලා, ඇන්ටිලා නොමැත. නම කියා ආමන්ත්‍රණය කිරීමට තරම් නිදහස් වන්න.**" ව්‍යාජ දේශප්‍රේමයට එරෙහිව මංගල ගොඩනැගූ සැබෑ දේශප්‍රේමියෝ කාර්යාලයේ පුවරුවක මංගල සටහන් කොට තිබුණේ එහෙමය.

එපමණක් නොව කුඩා දරුවන්ට උදේ හවස කවර තරාතිරමේ වුවද වැඩිහිටියන්ට වඳින්න පුරුදු පුහුණු කරන සංස්කෘතික සමාජයක මංගල තමන් ඉදිරියේ හිස නැමූ කුඩා දියණියක අමතා පවසා සිටියේ කවදාවත් දේශපාලකයන්ට වඳින්න එපා කියාය. තවකෙකු ඉදිරියේ කොන්ද නවන, හිස පහත්කරන සංස්කෘතියට මංගල එදිරි වූයේ එහෙමය.

තමන්ගේ ලිංගික ජීවිතයට ගරහන, අවලාද නගන අයවලුන්ට සිනාමුසුව මංගල පිළිතුරු දුන්නේ, "**ලේ උරාබොන කූඩැල්ලෙක් වෙනවට වඩා සමනළයෙක් වීම මට ආඩම්බරයක්**" කියාය.

මංගල සමරවීර රැඩිකල් ලිබරල්වාදියකු වන්නේ, මේ සුවිශේෂී ගුණාංගයන්ගෙන් පිරුණු ප්‍රායෝගික දේශපාලකයකු වීම නිසාය. දශක තුනක් පුරාවට අත්නොහළ සිහිනය ඉතිරි කර අද මංගල සමරවීර දිවියෙන් සමුගෙන දෙවසරක් ගතවී හමාරය. රනිල් වික්‍රමසිංහ වරෙක පවසා සිටියේ, "**මංගලගේ සිහිනය රටේම සිහිනය**" කියාය. අද අන්තිම රැඩිකල් ලිබරල්වාදියා ඉතිරි කර ගිය සිහිනය ඔස්සේ අන්තිම ක්ලැසිකල් ලිබරල්වාදියා අනේකවිද කෙනෙහිලිකම් හමුවේ නොනැවතී ඉදිරියට යමින් සිටියි. එකී සිහිනය මංගලගේවත් රනිල්ගේවත් හුදු පුද්ගලවාදී සිහිනයක් නොව අපි හැමෝගෙම සිහිනය යැයි මේ රටේ සියලු පුරවැසියන් තේරුම්ගෙන කටයුතු කරන දාක රටම නිදහසේ සිනාසෙනු ඇත. මංගලගේ සිහිනය ද එයමය.

**C.S.K. තුෂාර**

# විපක්ෂය රට ගිනිතබා, රට භාරගන්නේ කුමකටද?



කුරින්දි පුරාවිද්‍යා භූමිය සම්බන්ධ කරගෙන යළි ජාතිවාදී ආගම්වාදී ආරවුලක් ඇති කිරීමට යම් පිරිසක් කැසකවන බව අප පසුගිය සතියේ ප්‍රධාන පුවත මඟින් අනාවරණය කළේ යළිත් එවැනි මර උගුල්වලට හසුනොවී සිටීම විය යුතු බව අවධාරණය කරමිනි. මේ වර්ගවාදී ගැටුම් වෙනුවෙන් රටට ගෙවීමට ඇති වන්දිය තවම අවසන් නැත. තව බොහෝ කාලයක් යන තුරු ඉන් ගැලවීමක් නැත. එතරම් විනාශයක් අප සිදු කරගෙන තිබේ. රට බංකොළොත් වීම පිටුපසද ප්‍රධානම බලපෑම, මෙම වර්ගවාදී දේශපාලන කුමන්ත්‍රණ විය. කෙසේ නමුත් මේ වන විටත් රටට වින කරන කල්ලි එම ත්‍රාඩ උත්සාහයන් අත්හැර නැත. ඊයේ පෙරේදා ප්‍රධාන මාධ්‍යවල, සමාජ මාධ්‍යවල මේ රට තුළ වර්ගවාදී ගැටුමක් සිදුවීමට නියමිත බවට තොරතුරක් විදේශ බුද්ධි අංශ විසින් මෙරට බුද්ධි අංශවලට දැනුම් දී ඇති බව ප්‍රචාරයක් ගෙන යමින් තිබිණි. කිසිඳු මුලාශ්‍රයක් නැති මෙම පුවත නිර්මාණය කිරීමේ වුවමණාවද වර්ගවාදී ගැටුමකට අවශ්‍ය වටපිටාව සහ ජන මනස සැකසීම වෙනුවෙන් බව පැහැදිලිය. එම කාරණයටම උල්පන්දම් දෙමින් මේ ව්‍යාජ පුවත පදනම් කරගෙන විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මේ ගැන පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කර තිබුණේ මේ ව්‍යාජ පුවතේ අඩංගුව සත්‍යයක් ලෙස හැඟෙන අයුරිනි.

ජාති, ආගම් සට්ටනයක් හරහා සිදුවන තවත් පිපිරීමක් ගැන සඳහන් විදේශ බුද්ධි අංශ වාර්තාවක් සම්බන්ධයෙන් දෙස් විදෙස් මාධ්‍ය තොරතුරු අනාවරණය කර ඇති හෙයින් ඒ ගැන වහා තොරතුරු සොයා බලා මේ සභාව දැනුවත් කරන්නැයි සජිත් ප්‍රේමදාස පාර්ලිමේන්තුවේදී පවසා තිබිණි.

**"මේක ඉතා භයානක කාරණයක්. ඒ වගේම ජාතික ආරක්ෂාවට බලපාන කාරණයක්. වහාම දේශපාලන පක්ෂ කැඳවලා මෙය ඇත්තක්ද බොරුවක්ද කියලා හොයන්න ඕන. පාස්කු ප්‍රහාරය සමඟ ඇති වූ ආරක්ෂක ව්‍යාකූලත්වය අපි දැක්කා. මේ සංවේදී කාරණය ගැන රජය අවධානය යොමු කරන්න ඕන. ඊට පස්සේ මේ සභාව දැනුවත් කිරීමට කටයුතු කළ යුතුයි."**

සජිත් මෙහිදී මෙම වාර්තාව සත්‍යයක් ලෙස ගෙන ප්‍රශ්න මතු කිරීම මඟින් සිදුවන්නේ ජන සමාජයට එවැනි සිදුවීමක් ගැන භීතිය මෙන්ම අනෙක් ජන වර්ගයක් හෝ ආගමිකයන් ගැන වෛරයක් ද්වේශයක් ජනිත කිරීමය. මෙයින් සිදුවන හානිය ගැන ඔහු වගවීමක් ගන්නේ නැත. ඔහුට ජනතාව ගැන වගවීමක් තිබුණා නම් පැවසිය යුතුව තිබුණේ මෙවැනි මාධ්‍ය වාර්තා මත ජනතාව කලබල වන බවත්, එය වැලැක්විය යුතු බවත්, ඒ සම්බන්ධයෙන් රජය පියවර ගත යුතු බවත්ය. එමෙන්ම මෙවැනි පදනම් විරහිත පුවත් මත ජාතිවාදී ආගමික ගැටුම්වලට යැමෙන් ජනතාව වැලකීම විය යුතු බවට ජනතාවගෙන් ඉල්ලා සිටීමත්ය. නමුත් සිදු වූයේ ජනතාවත්, රජයත් අපහසුතාවයට පත් කරන සාහසික භාවිතාවකි.

ඒ කෙසේ නමුත් මේ සම්බන්ධයෙන් ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් පාර්ලිමේන්තුවේදී පවසා සිටියේ ජාතික ආරක්ෂාව සහ ජාතිවාද කෝලාහල සම්බන්ධයෙන් විදේශ බුද්ධි අංශයකින් කිසිම තොරතුරක් ලැබී නැති බව වගකීමෙන් ප්‍රකාශ කරන බවය.

**"විවිධ කට කතා, ෆේස්බුක් පණිවිඩවලට උත්තර දි දී ඉන්න බැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට කරුණු දක්වනවා. රටේ සමහර තැන්වල සමහර කණ්ඩායම් දේශපාලනික උත්තේජනය උඩ මේ රටේ ජාතිවාදී කලබල හා කෝලාහල ඇති කිරීමට විවිධ උත්සාහ ගන්න බව අපිට පැහැදිලිව නිරීක්ෂණය වනවා. ඒ කණ්ඩායම් ගැන රජයේ ආරක්ෂක අංශ රජය අවධානය යොමු කරලා තියෙනවා."** යනුවෙන්ද අවධාරණය කර තිබිණි.

කොහොම නමුත් ජාතිවාදය ආගම්වාදය බංකොළොත් දේශපාලන තක්කඩියන්ගේ ජනප්‍රිය තේරීමක් වන නිසා මේ ත්‍රාඩ මෙහෙයුම් ලෙහෙසියෙන් අත්හරින්නේ නැත. එවැනි දේ අත්හරින්නට තරම් ශිෂ්ඨ සම්පන්න බවක්, දියුණුවක් මෙරට දේශපාලනඥයන් සතුව තිබුණේ නම් මේ සුන්දර රට මෙතරම් ජරාජීර්ණය වන්නේ නැත. එහෙත් වර්තමානයෙහි බහුතර පුරවැසි ජනතාව මේ මුග්ධ දේශපාලනඥයන් අභිබවමින් ඉදිරිගාමී තැනක සිටින බව විශ්වාස කරන්නට තරම් කරුණු කාරණා යෙදී තිබේ. වර්ගවාදී දේශපාලන මෙහෙයුම් කුමන්ත්‍රණ හඳුනාගැනීමේ පරිචයක් ඔවුන්ට තිබේ. පටු පක්ෂ දේශපාලනය වෙනුවට රට ගොඩනගන සාමූහිකත්වයක් අපේක්ෂා කරමින් වත්මන් රජයට බහුතර ජනතාවක් සහය පළ කරන්නේ එබැවිනි.

මේ පුරවැසි ජනතාව සමඟ අප නැවතත් අවධාරණයෙන් පවසන්නේ,

*"ශ්‍රී ලංකා මාතාව අද ඉල්ලා සිටින්නේ මේ ජාතිවාදී ආගමික දේශපාලන තක්කඩියන්ගේ වුවමණාව සංතර්පණය කිරීම නොවේ. රටේ සියලු පුරවැසියන් ශ්‍රී ලාංකිකයන් ලෙස ගොඩනැංවීමකි. කිසිවකුට වෙනස් ලෙස නොසලකන, සෑම සියලු දෙනාගේම අයිතිවාසිකම් සහ නිදහස සුරක්ෂිතවන, එකිනෙකාට ගරුකරන, එකිනෙකාව බලාගන්නා ආදරණීය රටකි. ඇය එක් එක් පාර්ශ්වික වුවමණාවන් නිසා ඉතිහාසය පුරාම අතිශය වදවේදනාවන්ට ලක් විය. දුක් වින්දාය. දැන්වත් ඇයට කරන කෙනෙහිලි අවසන් කළ යුතුව තිබේ. ඇයව ආදරයෙන් රැක බලාගත යුතුය."* යන්නය.

විපක්ෂ දේශපාලන පක්ෂ සහ රජයට එරෙහිව කටයුතු කරන කල්ලි කණ්ඩායම් නිරන්තරයෙන්ම අතිශය වගකීම් විරහිත ලෙස ජනතාවම බිල්ලට ගන්නා දේශපාලන ව්‍යාපෘතින්වල නිරතව සිටින බව ජනාධිපති රනිල් බලයට පත්වීමේ සිට දකින්නට ලැබුණකි. රනිල් අභිබවා යැමට නොහැකිව අසරණව සිටින විපක්ෂයේ තේරීම වූයේ රට අර්බුදයට යවා ජනතාව බිල්ලට ගෙන තමන්ට බලය අත්පත් කර ගැනීමේ බාල උපක්‍රමයය. රට අර්බුදයෙන් මුදාගැනීමට තිබූ එකම විකල්ප ක්‍රමවේදය වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යැම පමණක් වුවත් එයත් වැලැක්වීමට විපක්ෂය කෙතරම් දැඟලුවාද යන්න මේ රටේ මිනිස්සුන්ට අමතක නැත. ආර්ථික හා දේශපාලනික ප්‍රතිසංස්කරණයන් වැලැක්වීමට, රටේ මහා ආහාර හිඟයක් ගැන, මන්දපෝෂණයක් ගැන, මහා ඖෂධ හිඟයක් ගැන, වෛද්‍යවරුන් හා වෘත්තිකයන්ගේ හිඟයක් ගැන, බැංකු කඩා වැටෙන බව, සේවක අර්ථසාධකය හොරා කෑමක් ගැන, පදනම් විරහිත, කරුණු විකෘති කළ, බොරු බේගල් කතන්දර රැසක් සමාජගත කිරීම සිදු කළේය. නමුත් මේවා කිසිවක් සත්‍යයන් බවට පත් වුයේ නැත. එසේම බරපතල ඡන්දගායකින් පෙළෙමින් රට අර්බුදයක් සමයේ මැතිවරණ පවත්වමින් තවත් නැති අර්බුද ඇති කිරීමට දත කැවේය. නමුත් කිසිඳු විටක රජය, රට අර්බුදයෙන් ගොඩගැනීමට ගත් කිසිඳු පියවරකට සහය වුයේ නැත. දැවැන්ත බේදවාචකයක් බවට පත්වීමට තිබූ රට එයින් මුදවා ජනතාව පීඩාවට පත්වීම වැලැක්වීම වෙනුවෙන් ගත් කෙටි කාලීන හා දීර්ඝ කාලීන විසඳුම් ගැන අගය කිරීමක් කළේ නැත. අඩුම තරමින් මේ මොහොතේ ජනාධිපතිවරයා හෝ වෙන කිසිවකු විසින් හෝ මැදිහත්ව, මේ බරපතල ප්‍රශ්න කවර දුෂ්කර තීන්දු ගෙන හෝ විසඳනවා නම්, එය අනාගතයේදී තමන්ගේ ආණ්ඩු සමයකදී තමන්ගේ පාලනයට පහසුවක් ගෙන එන්නක් ලෙස හෝ කල්පනා කිරීමට මේ විපක්ෂට නොහැකිව තිබේ. 2048 සංවර්ධන සිහිනය වෙනුවෙන් ජනපති රනිල් ඉදිරිපත් කරන වඩාත් නිවැරදිම ආර්ථික හා දේශපාලනික ප්‍රතිපත්ති, වැඩපිළිවෙල ඉදිරියට කරගෙන ගොස් ඒ සිහිනය සැබෑ කිරීමේ වගකීම යම් මොහොතක තමන් මත පැටවෙන වගකීමක් බව ඔවුන්ට කල්පනා වෙන්නේ නැත. විශේෂයෙන්ම තමන් සතුව කිසිඳු විසඳුමක්, වැඩපිළිවෙලක් නොමැති තැන, ඊට විසඳුමක් ජනාධිපතිවරයා ඉදිරිපත් කර තිබෙන මොහොතක එය භාරගැනීම විපක්ෂය වෙතින් විය යුතුව තිබෙන්නකි. ඊට ලැජ්ජාවක් තිබේ නම් සාධනීය විවේචනාත්මක සහයෝගයකට හෝ එළැඹිය හැකිය. එසේත් නොහැකි නම් ඊට බාධා නොකර පැත්තකට විය යුතුය.

රට බංකොලොත් වන විට රට භාරගැනීම මඟ හැර සිටි විපක්ෂය දැන් ජනපති රනිල් බංකොලොත්භවයෙන් රට මුදවා සංවර්ධන මාවතට රට ඇද දැමීමට තරම් වැඩ කොටසක් ඉටු කරමින් සිටියදී විපක්ෂයේ එකම අරමුණව තිබෙන්නේ කෙසේ හෝ බලය ඩැහැගැනීමය. එහෙත් ඒ රට ගැන, ජනතාව ගැන වගකීමකින් තොරවය. පසුගියදා බන්දුල ගුණවර්ධන ඇමැතිවරයා විපක්ෂයෙන් ප්‍රශ්නකර සිටියේ රජය දැන් ක්‍රියාත්මක කරන ණය ප්‍රතිව්‍යුහගතකරණ වැඩපිළිවෙල හැර අඩුම තරමින් රටේ ණය ප්‍රශ්නය විසඳීමට වික්ෂයේ යෝජනාවක් හෝ තිබෙනවාද යන්නය.

*"...ඊළඟට කවුරු ආණ්ඩු කළත් ඒ ණය ගෙවන්න සිදුවෙනවා. ඒ ණය ගෙවන්නේ කොහොමද යන්න පිළිබඳව නිශ්චිත අදහසක් නැතුව කවුරු ආණ්ඩු කළත් කාටවත් මේක කරන්න බැහැ. මෙය බරපතළ කරුණක්. මුදල් අමාත්‍යාංශය 2022 වසර වෙනුවෙන් නිකුත් කළ වාර්තාව අනුව රජය විසින් ලබාගත් ණය, ආපසු ගෙවීමට ඇති විදේශ ණය ප්‍රමාණය අමෙරිකානු ඩොලර් බිලියන 35.96ක්.*


*විදේශීය ණයවලින් 37%ක් ඉදිරි වසර පහ තුළ කල් පිරිමට නියමිතයි. 51%කට ආසන්න ප්‍රමාණයක් වසර හය සහ විස්ස අතර කල් පිරීමට නියමිතයි. මේකයි අපි අවධානයට යොමු කළ යුත්තේ. ඉදිරි වසර පහේදි අපි ගෙවන්න උත්සාහ කරන්නේ කල් පිරුණු ඒවායින් 37%කයි. ඉතිරි 51%ක් ගෙවන්න තිබෙන්නේ වසර හය සහ විස්ස අතරෙදි. අපි ඉන්නේ 2023නේ. 2048 වන තෙක් නිදහස ලබා වසර සියයක් වන විටත් මේ ණයවල කල් පිරෙනවා.*

*අපි හිතමු එතකොට ආණ්ඩුවේ ඉන්නේ ඔබතුමාලා කියලා. 2025.06.03 වැනිදාට ගෙවන්න තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 650ක්. 2025.11.03 වැනි දා වනවිට ගෙවන්න නියමිතව තිබෙනවා ඇමෙරිකානු ඩොලර් මිලියන 1,500ක්. 2025.07.18 වැනි දා විට බිලියන 1,000ක් ගෙවන්න තිබෙනවා. 2027.05.11 වන විට ගෙවන්නට වෙනවා, මිලියන 1,500ක්. 2023.04.08 වැනි දා වන විට මිලියන 1,250ක් ගෙවන්න වෙනවා. 2028 මාර්තු මාසය වන විට මිලියන 1,000ක් ගෙවන්න වෙනවා. 2029.03.14 වැනිදා වනවිට මිලියන 1,000ක් ගෙවන්න තිබෙනවා. 2030.01.28 වැනි දා වනවිට ගෙවන්න තිබෙනවා, මිලියන 1,500ක්. මේ ටික පාර්ලිමේන්තුවට දීලා තිබෙන්නේ. නමුත් කවුරුත් කතා කරන්නේ නැහැ. ඒ වගේම 2030 කවුරු ආණ්ඩු කළත් ජනතාවට බොරුවක් තමයි කරන්න වෙන්නේ. මේක ගෙවන්නේ නැතිව කරන්නේ කොහොමද? ජාත්‍යන්තර තත්ත්වය පිළිබඳව අපි කාටවත් වසන් කරන්න දෙයක් නැහැ. අපි ණය ලබා ගන්නේ කොන්දේසිවලට යටත්ව. ඒ වගේම ඒ ගන්නා ණය ගෙවීමට ලංකා ආණ්ඩුව බැඳී සිටිනවා.*

*...ඔබතුමාලා හිතනවද ආණ්ඩුව මාරු කරලා වෙනත් ආණ්ඩුවක් අරන් ණය ගෙවන්නේ නැතිව කරගෙන යන්න පුළුවන් කියලා. මේ පොඩි දරුවො වගේ හැසිරෙන්න එපා. ගත්ත ණය ගෙවන්න වෙනවා. ජාත්‍යන්තර මූල්‍ය ක්‍රමය පිළිබඳව ආයතන තිබෙනවා. රේටින් ආයතන විසින් අපි ඩවුන් කරලා ණය ගෙවන්න බැරි රටක් ලෙස කියනවා... අපි **L.C.** එකක් ඕපන් කරනවා, තෙල් ගේන්න. මේ **L.C.** එක හෙවත් ණයවර ලිපි පිළිගන්නේ නැත්නම්, ඇගේ තෙලට වාහන දුවන්න බැහැ. හිතවත්කමට රෝද කැරකෙන්නේ නැහැ. ගෑස් නැව එනවා. **L.C.** එක පිළිගන්නේ නැත්තම් මොකද කරන්නේ. ගෑස් කඳුළක්වත් අපට නැහැ. බෙහෙත්වලට **L.C.** එක නැත්තම් අපට බෙහෙත් නැහැ. අපට චණ්ඩි කතා කිය කියා ඉන්න බැහැ. අධිරාජ්‍යවාදයට, **I.M.F.** එකට විරුද්ධයි කියා කියමින් සිටිය නොහැකියි... බ්‍රිතාන්‍ය යුගයේ සිට අපි තේ, පොල්, රබර් යවලා අපට ලැබෙන්නේ කීයද? වසරකටම ඇමෙරිකන් ඩොලර් බිලියන 1.3යි. මේ වගේ දෙගුණයක් දාලා තේ වැවුවත් ඒ ආදායම දෙගුණ කරන්න පුළුවන්ද? අපි කොහොමද ණය ටික ගෙවන්නෙ? හම්බන්තොට වරාය වගේ එකක් විකුණුවත් ලැබෙන්නේ 1.4 යි. වරාය නගරය දුන්නත් කීය ද ලැබෙන්නේ? ...අනිත් දේවල් ඔක්කොම දුන්නත් කීයද ලැබෙන්නේ? දැන් මේ අරක කරන්නලු. මේක කරන්නලු. ප්‍රවාහන ඇමැති මම. ඔබතුමාලාගේ පැත්තේත් පාරවල් කැඩිලා. මිනිසුන්ට යන්න බැහැ. මේ දේවල් හදලා තිබෙන්නේ **A.D.B.** එකෙන්. මේවාගේ පැලැස්තර දාලා වහන්නත් විශාල මුදලක් ඕනෑ. නියෝජිතයෝ එක්ක ගිහින් පෙන්නුවා. ඒ අය කියන්නේ (ණය) රී-ෂෙඩුල් කරනකම් දෙන්න බැහැ කියලයි. මිනිස්සු වෛරයෙන් ගෙවල් ගිනි තියන්න පුළුවන්. බණින්න පුළුවන්. මොකක්ද උත්තරය? ප්‍රාතිහාර්ය පාන්න පුළුවන්ද කාටහරි..."*

මේ ප්‍රශ්නවලට විපක්ෂය සතුව පිළිතුරු නැත. ඇත්ත එයය. මේ අය රට භාර ගන්නවා කියන්නේම රට යළි බංකොළොත් වීම පමණක් බව පැහැදිලිය. පටු දේශපාලනික වුවමණාවන් මත බොරු බේගල් ඇද දමා රාජ්‍ය බලය අත්පත් කරගත්තත් රටේ අර්බුද විසඳන්න සමත්කමක් හෝ ඒ ගැන අදහසක්වත් නොමැති නම් කවර වුවමණාවකට විපක්ෂයට රට භාර දිය යුතුද? මේ අනුව මේ විපක්ෂයේ මර උගුල්වලට හසු නොවී සිටීමට ජනතාව සමත් වන තාක් රටට අනාගතයක් තිබෙන බව පැහැදිලි කරුණකි.

සෝෂක



# ඉන්දියානු විරෝධය ලාබෙට ගත් සටන් පාඨයක්

දේශපාලනය කරන්න නිවැරදි සටන් පාඨ හිඟවීම මේ රටේ තිබෙන විශාල ප්‍රශ්නයක්. පටු පක්ෂ දේශපාලනයෙන් එපිට පවතින දේශපාලනයේ අරමුණ මොකක්ද කියන එක නොදන්නාකම මේ සටන් පාඨ හිඟයට හේතුවක්. රාජ්‍ය බලය අත්පත් කරගැනීම හෝ එය වෙනස් කිරීම සම්බන්ධයෙන් බලය පාවිච්චි කිරීම විය යුතු නමුත් ඒ බලය වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ග අවසානයේදී රාජ්‍යයට අවැඩක් වන්නේ නම් ඒ දේශපාලනයෙන් ඇති වැඩක් නැත. රටට හානිදායකය. එහෙත් රාජ්‍යයත් බේරාගෙන තමන්ගේ පක්ෂ දේශපාලනයත් බේරා ගැනීම අමාරු වැඩකි. මිල අධික වැඩකි. ඊට නිවැරදි සටන් පාඨ තිබිය යුතුයි. නමුත් රටේ දේශපාලනයේ තිබෙන දුප්පත්කම නිසා අල්ලා ගන්නේම ලාබෙට ගන්න පුළුවන් වැරදි සටන් පාඨයන්. **"ඉන්දියානු විරෝධය"** කියන්නෙත් එහෙම එකක්. ඒ වගේම මෙය සෑහෙන පරණ කල් ඉකුත්ව තිබෙන නමුත් නිරන්තරයෙන් අලුත් අයිසින් දමා පෙන්වන පුස් කේක් ගෙඩියක්. මෙය පෙන්වා මිනිස්සු රැවැටීමට පුළුවන්. නමුත් දැන් මේවාට රැවටිලා බොහෝ අලාබ හානි සිදු කරගෙන මිනිස්සු පාඩම් ඉගෙනගෙන තිබෙනවා. එය තවම මේ රටේ ජාති(ක)වාදී සහ වාමාංශික පක්ෂ හෝ කුඩා කල්ලි කණ්ඩායම්වලට නොතේරෙන දෙයක්. ඒ දේශපාලනික දුප්පත්කම නිසයි.

මේ දිනවල ඊනියා ඉන්දියානු විරෝධය නඩත්තු කරගෙන යෑමට ඉදිරිපත්ව සිටින ප්‍රමුඛ කණ්ඩායමක් වන්නේ පෙරටුගාමී සමාජවාදී පක්ෂයයි. ඔවුන්ගේ පීතෘ උරුමය නැතිනම් ජනතා විමුක්ති පෙරමුණෙන් ලැබුණු මේ දායාදය කිසි වග විභාගයක් නැතිව ආරක්ෂා කරගෙන යන්න ඔවුන්ට සිදුව තිබෙන බවත් පැහැදිලියි. පසුගිය දිනවල ජනාධිපති රනිල් වික්‍රමසිංහ සිය ඉන්දියානු සංචාරය තුළදී අගමැති මෝදි සමඟ එකඟතා ගණනාවකට එළඹ තිබුණා. මෙය අතිශය වැදගත් එළැඹුමක් බව කිව යුතුයි. මොකද මේ එකඟතාවයට පිවිසීමට බොහෝ කාලයක් මෙරටට බලාගෙන සිටිනන්ට සිදුව තිබීම නිසයි. රටේ අභිවෘද්ධිය වෙනුවෙන් කලාපීය සහයෝගය, ඉන්දියානු සහයෝගය මෙරටට අත්‍යාවශ්‍යව තිබුණු නමුත් මෙරටේ ජාති(ක)වාදී වාමාංශික මුග්ධ දේශපාලනය විසින් එය වළකා තිබුණා.

කොහොම නමුත් මෙම එකඟතාවයට එරෙහිව පෙරටුගාමී පක්ෂයත් එහි පතුරු සංවිධානයක් වන ජන අරගල ව්‍යාපාරයත් ප්‍රචාරක කටයුත්තක නියැලෙමින් තිබෙනවා. ඒ අනුව පසුගියදා නිකුත් කර තිබූ අත්පත්‍රිකාවක සඳහන්ව තිබූ කරුණු අනුව පැහැදිලි වන්නේ ඇත්ත වශයෙන්ම මෙම එකඟතාවයන්ට එරෙහිවන්නෙත් ඒ පිළිබඳ මෙලෝ අලබෝලයක් හෝ නොදැන බව පැහැදිලියි. එවගේම මෙම පිරිස නූතනයේ ක්‍රියාත්මක හා පිළිගන්නා ගෝලීය දේශපාලනය ආර්ථිකය ගැන අංශුමාත්‍රයක දෙයක් නොදන්නා ළිං මැඩියන් බවක් පෙන්නුම් කරනවා. ඒ නිසා ලෝකය නිදහස් - විවෘත සහ වහල් - සංවෘත්ත ලෙස බෙදා වෙන් කළ බර්ලින් තාප්පය බිඳ දමා ඇති බවත් එය යළි ගොඩනැගීමට ජනතාව ඉඩ නොදෙන බවත් මේ අයට දේශපාලන අවබෝධයක් ද නැත.

මේ අනුව ඉන්දීය සහසම්බන්ධිත ආර්ථික මුලෝපාය ගැන මේ අය කියන්නේ ජනාධිපති රනිල් මුළුමහත් ජනතාවගේ ඉරණම, රටේ භූමිය හා සැලකිය යුතු සම්පත්වල අනාගතයත් බිල්ලට දෙමින්, බලශක්ති ස්වාධිපත්‍යය පාවා දෙමින්, ගිවිසුම් ගණනාවකට එළැඹුණ බවයි. නමුත් මේ ගිවිසුම් අඩුම තරමින් රටේ ජනතාවගෙන් කිසිවකුට දකින්න ලැබී නැති බවත් කියයි. ඒ අනුව පෙරටුගාමීන්ද මෙම විරෝධය මතු කරන්නෙ මෙම ගිවිසුම් ගැන කිසිවක් නොදැන බවත් පැහැදිලියි. මේ අය තව දුරටත් කියන්නේ ජනපති රනිල් සියවසකටවත් ගැලවෙන්න බැරි ගිවිසුම්වලට අපි වගේම නූපන් පරපුරත් පටලමින් සිටින බවයි. නමුත් ඇත්ත කතාව මෙම ගිවිසුම්වල අප පැටලෙන්න තිබුණේ සියවසකට පෙරය. රාම සේතු පාලම ගැන යෝජනාව ආවේ ඒ කාලයේදීය. එසේ වූවා නම් අද රට තිබෙන්නේ මේ බංකොලොත් තැන නොවේ. ඉන්දියාවට සමගාමී හෝ ඊට ඉහළ සංවර්ධනයක් අත්පත් කරගන්න තිබුණා. ඊට අවශ්‍ය හැකියාවන් රටට තිබුණා.

දැන් මේ පෙරටුගාමීන්ගේ පත්‍රිකාව අනුව ගිවිසුම් මේවාය.

1. **ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ඉන්දියානු ආර්ථික කලාපයක් පිහිටුවීම, මෙම කලාපය කොළඹ දිස්ත්‍රික්කය තරම් විශාලය. ත්‍රි'මලේ වරාය තෙල් ටැංකි ඉඩම් සියල්ල අත්පත් කර ගන්නවා. ඒක තමයි අවසන් ඵලය.**
2. **ලංකාව හා ඉන්දියාව අතර විදුලි බලපද්ධතිය සම්බන්ධ කරමින් රටේ බලශක්ති ස්වාධිපතය ඉන්දියාව අතට ගන්නවා.**
3. **ලංකාව ඉන්දීයාව හා ගොඩබිමෙන් සම්බන්ධ කරනවා.**
4. **දෙරට තෙල් නලයකින් සම්බන්ධ කරනවා. ලංකවට ලාබ ඉපයිය හැකි නැව් තෙල් වෙළදාම ඉන්දියාව සතු කරගන්නවා.**
5. **ලංකාව සතු හයිඩ්‍රෝකාබන් ගවේෂණය හා නිෂ්පාදනය, මන්නාරම් ද්‍රෝණියේ ස්වභාවික සම්පත් කොල්ල කනවා.**
6. **ලංකාවේ වෙළඳ කටයුතු සඳහා ඉන්දීයානු රුපියල යොදා ගන්නවා. ඒකෙන් ලංකාවෙ මුදල් ඒකකය අර්බුදයට ගිහින් ඉන්දියාවේ ආර්ථික ආධිපත්‍යයට තව ප්‍රබල වෙනවා.**
7. **ත්‍රිකුණාමලය සිට කොළඹ දක්වා ආර්ථික බිම් තීරුවක් සංවර්ධනය කරනවා. එම බිම් තීරුව කුමක් සඳහා ද යන්න අපැහැදිලියි.**
8. **සාම්පූර් සූර්ය බල ශක්ති මධ්‍යස්ථානයක් ඇති කරනවා.**

**9 ඒකාබද්ධ සත්ව පාලන වැඩසටහන.**

මේ ලැයිස්තුව් තව දික් වෙන්නත් පුලුවන් කියලත් මේ පෙරටුගමීන් පවසනවා. නැගෙනහිර වරාය ජැටිය, මත්තල ගුවන් තොටුපොල, ත්‍රිකුණාමලයේ සිට ඉන්දියාව දක්වාම දුම්රිය මාර්ගය, අනුරාධපුර පොස්පේට් නිධිය. ඒවත් ඉන්දියාවට යනවා කියනවා. බැලූ බැල්මටම මේවා කෙතරම් විහිළු සහගතද යන්න ළමයකුට වුවත් තේරුම් ගත හැකියි.

මේ කියන කාරණාවලට එරෙහි වෙන්න කියලා පෙරටුගමීන් තවත් වැල්වටාරම් ගොඩක් කියමින් මහා බිල්ලකු මැවීමේ උත්සහයක නිරත වෙමින් සිටින බව පැහැදිලියි. මේවා අලුත් දේවල් නොවේ. නිදහසට පෙර ඉතිහාසයෙත් ඉන් පසුව අඛණ්ඩවම දොඩවපු බොරු වැල්වටාරම්. ඉහත කී ගිවිසුම් අනුව විරුද්ධ විය හැකි කිසිවක් නැත. ඒ විය යුතුව තිබෙන්නක්. ඒ එකින් එක කරුණු දක්වමින් එයින් රටට ඇති ප්‍රතිලාභ ගැන කතා කළ හැකියි. ඉන්දියාව සමඟ මෙම ගනුදෙනුවට නොගිහින් පෙරටුගාමීන් හෝ ඔවුන්ගේ පීතෘ පක්ෂය වන ජවිපෙ හෝ යෝජනා කරන්නේ වෙන කුමක් කළ යුතු බවද? මේ සංවර්ධන ව්‍යාපෘතීන් අත්හල යුතු බවද?

නැතිනම් සිය පක්ෂපාතිත්වය ඇති චීනය සමඟ මෙම ගනුදෙනුව කරමු කියලද? නැතිනම් රටේ ස්වාධිපත්‍ය සවෛරීභාවය රැකගෙන ලෝකෙන් උතුම් රට ශ්‍රී ලංකාවයි කියාගෙන මේ ජාතික සම්පත්වලට අත තියන්න කාටවත් දෙන්නේ නැතැයි කියමින් සඟවාගෙන බදාගෙන රැක ගැනීමද? මේ ජාතික සම්පත්ය කියන ඒවා රැක ගැනීමෙන් සිදු වුණේ මේච්චර කාලයකට වක්කඩේ හකුරු හැංගුවා වගේ දෙයක් නොවේද? අවසානයේ රොඩු ගොඩක් ඉතිරි කරගැනීම හැර වෙනකක් සිදුව තිබේද? අඩුම තරමින් රටේ භූමියේ පිහිටීම මඟින් ලැබිය හැකි අවස්ථා කෙතරම් රටට අහිමි කරගෙන තිබෙනවාද? ඉන්දියාව සමඟ මීට පෙර අවස්ථා ගණනාවකදී එළැඹෙන්නට උත්සහ කළ ගිවිසුම් වැලැක්වීම මඟින් රටට අත්පත් කරගත් අමුතු ලාබයක් තිබේද?

අද ගෝලීය වශයෙන් ක්‍රියාත්මක වන ආර්ථික යාන්ත්‍රණයට පිටුපා රටට පැවැතිය නොහැකි බව පැහැදිලිම යථාර්තයක්. එමෙන්ම ගෝලිය භූ-දේශපාලනික සම්බන්ධතා ක්‍රියාත්මකවීම අනුව ලංකාවට එය මඟ හැර පැවැතිය නොහැකියි. ඉන්දියාව ලෝකයේ ආර්ථික හා දේශපාලනික ප්‍රබලයකු ලෙස නැගී සිටින විට, දකුණු හා අග්නිදිග ආසියානු කලාපය ආර්තික වශයෙන් වේගවත්ම වර්ධනය අත්පත් කරගනිමින් සිටින විට ඒ සියල්ලෙන් හුදකලා පැවැත්මක් රටට නැත. ඉන්දියාව අද ලෝකයේ පස්වන ආර්ථික බලවතා ලෙස ජය ගෙන අවසන්ය. සඳ ජයගත් සතරවැනි රාජ්‍යය බවට පත්ව තිබෙනවා. එමෙන්ම න්‍යෂ්ඨික බලවතෙක්. ලෝකයේ ප්‍රධාන පෙළේ ව්‍යාපාර බහුතරයක විධායකයන් වී ඇත්තෙත් ඉන්දියානුවන්ය. ක්‍රීඩාව, කලාව, තොරතුරු තාක්ෂණය, ආදියෙන් ඉන්දියානුවන් කිසිවකුට දෙවැනි නැත. ඉන්දියාව සහල් අපනයනය නැවැත්තුවොත් ලෝකයෙන් භාගයක් බඩගින්නේය. ඖෂධ අපනයනය නැවැත්තුවොත් ලොකයෙන් භාගයක් මරණ මංචකයේය. මේ හැකියාව නැතිනම් බලය පාවිච්චිකර දකුණු ආසියානු කලාපය වෙනම ආර්ථික හා දේශපාලනික කලාපයක් ලෙස ගොඩනැංවීම වෙනුවෙන් අද ඉන්දියාව මෙහෙයුමක සිටියි. ඒ තනියම රජවීමට නොවේ.

එවැනි රටක් අල්ලපු වැටේ තිබියදී ඊට එරෙහිව හෝ එය මඟහැර හෝ යනවා වෙනුවට එහි සහය රැකවරණය ලබා ගැනීම විය යුතු දෙයක්. ඒවගේම ඉන්දියාවේ වේගවත් සංවර්ධන ක්‍රියාදාමයේදී ශ්‍රී ලංකාව යනු ඉන්දියාවේ වැදගත්ම සහයක සගයෙක්. ඒ වටිනාකම ඉන්දියාව හැමදාම මේ රටට ලබාදීමට මැලි වී නැත. ආර්ථික අර්බුද සමයේදී මෙරටට සහය වූයේ මේ රට වැටුණොත් එය ඉන්දියාවටද බලපවත්වන නිසයි. ලංකාවේ සහය ඔවුන්ට අවශ්‍යයි. ඊයේ පෙරේදාත් ඉන්දීය විදේශ ඇමැති ආචාර්ය එස්. ජයශංකර් කියා සිටියේ ආහාර සුරක්ෂිතතාව, බලශක්තිය, මුල්‍ය සහයෝගිතාව සහ දිගුකාලීන ආයෝජන යන අංශ හතර ඔස්සේ ඉන්දියාවේ සහයෝගය ඉදිරියටත් ලැබෙන බවයි.

එම තත්වයන්ද මෙරට පුරවැසියා තේරුම් ගත යුතුයි. ඉන්දියානු විරෝධය ගොඩනැන්වීමෙන් සිදුවන්නේ යළිත් වතාවක් ඉන්දියාවෙන් මෙරට සංවර්ධනයට ඇවැසි සහය අහිමි කර ගැනීම පමණක් නොව රට තවදුරටත් මේ බංකොලොත්භාවයේම තබා ගැනීමයි.

නමුත් ජවිපෙ, පෙරටුගාමී මෙන්ම ජාතිවාදී බලවේගවල ත්‍රාඩ, මුග්ධ දේශපාලනයට පැවැත්මක් ඇත්තේ රට බංකොලොත් භාවයේ පැවැතීම තුළ පමණයි. ඉන්දියානු විරෝධයේ එක් පදනමක් වන්නේ එයයි. අනෙක ජාත්‍යන්තර කූට දේශපාලනික වුවමණාවන්ය. ඉන්දියාව සමඟ රට නැඟී සිටීම වැලැක්වීමේ ජාත්‍යන්තර වුවමණාවන් ක්‍රියාත්මක වන බව රහසක් නොවෙයි. සමහර විට ජවිපෙ පෙරටුගාමී ආදී සුළු පක්ෂ මේවායේ කොන්ත්‍රාත් කරනවාද විය හැකියි.

එදා ජවිපෙ නිර්මාතෘ රෝහණ විජේවීර ඉන්දියානු ව්‍යාප්තවාදයක් ගැන කියමින් ඉන්දියානු විරෝධය තමන්ගේ දේශපාලනය බවට පත් කරගත්තේ හුදු ප්‍රචාරක උපක්‍රමයක් වශයෙන් මිස වෙන ඇත්ත පදනමක් ඇතිව නොවේ. විශේෂයෙන්ම දෙමළ විරෝධය සිංහල බෞද්ධ වර්ගවාදය පක්ෂයේ දේශපාලන අනන්‍යතාවය කරගැනීම අනුවයි. එයට විජේවීරගේ චීනයේ සමාජවාදී දේශපාලන හිතවත් කමද බලපෑවා. අද ජවිපෙත් පෙරටුගාමීනුත් ඉන්නේ ඒ ආකල්පයේමයි. එසේ නොමැතිව මේ ගොඩනගන ඉන්දීය විරෝධය තුළ ගත යුත්තක් නැත. ජාතිවාදී ස්ථාවරයේම සිටින අයගේ පැවැත්ම සහතික වන්නේත් අන්‍ය ජාතීන්ට එරෙහිවීම තුළම පමණයි. ඔවුන්ට ඉන්දියාව සතුරු රාජ්‍යයක්. ඒ දෙමළ ජනතාවගේ අයිතීන් සම්බන්ධයෙන් ඉන්දියාව උනන්දු වන නිසයි. ඒ පැහැදිලි කරදීමට පරණ යුද්ධ කතාවල සිට හණ මිටි කතන්දර තොගයක් ඔවුන් සතුව ගොඩ ගහගෙන තිබෙනවා.

කොහොම වුණත් ඉන්දියානු විරෝධය නඩත්තු කිරීම වෙනුවෙන් ගෙන එන කිසිදු තර්කයක් සලකා බැලිය හැකි පදනමක් අද නැත. ඉන්දියාව සමඟ වන සහසම්බන්ධිත ආර්ථිකයක් හරහා රටට අත්පත් කරගත හැකි ප්‍රතිලාභ ගැන ඕනෑ තරම් විද්වත් මත පළ වී තිබෙනවා. නේපාලය, බංග්ලාදේශය, භූතානය වැනි රටවල් දැන් එහි ප්‍රතිපල භුක්ති විඳිමිනුත් තිබෙනවා. නමුත් මේ රටවල් ඉන්දියානු ආධිපත්‍යයට යටවී නැත. ඒ රටවල් මේ සහසම්බන්ධයන් සමඟ තවදුරටත් ශක්තිමත් රාජ්‍යයන් බවට නම් පත්ව තිබෙනවා.

ඉන්දියාව සමඟ එකඟතාවයන්ට එළැඹීම මගින් ඉන්දියාව මෙරට තුළ සිය ආධිපත්‍ය පතුරුවනවාය, එමඟින් රටේ දේශපාලනික ආර්ථික අයිතිවාසිකම් අහිමි වෙනවාය, කියන කතන්දරය සියවස් ගණනාවකට පෙර කිව හැකිව තිබූ දෙයක් විනා නූතනයට කිසිසේත් ගැලපෙනේනේ නැත. අද ඉන්දියාවේ භූ-දේශපාලනික උපාය මාර්ගය වන්නේ දකුණු ආසියාවම සමඟ වන සහසම්බන්ධිත දේශපාලන ආර්ථිකයකට යොමු වීමයි. එකිනෙකාගේ සහයෝග යෙන් එක්ව නැගී සිටීම විය යුතු බවයි. රටවල් වෙන් වෙන්ව එකට එකතුවීම, වඩා ශක්ති සම්පන්න කලාපීය එකතුවක් ගොඩ නැගීම විය යුතු වීම ඉන්දියාවේ දැක්මයි. එය අත්‍යාවශ්‍ය දෙයක්. ජනාධිපති රනිල් වික්‍රමසිංහ පෙනී සිටින්නේද ඒ වෙනුවෙන්. ඉන්දියාව ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වන විට එහි ඵලප්‍රයෝජනය රටට ලැබෙන බව ජනාධිපතිවරයාගෙත් ස්ථාවරයයි. එවගේම එය ලබාගැනිමට රට සමත් කිරීම ඔහුගේ අභිප්‍රාය බවත් පැහැදිලියි. මේ අනුව "ඉන්දියානු විරෝධය" රටට එරෙහි ලාබ සටන් පාඨයක් විනා, රටට වැඩක් ඇති දෙයක් නොවන බව නැවත කිව යුතුයි. මොකද ඊට වඩා ඇත්තක් නැති නිසාය.

ප්‍රභාත් ජයසුමන

# මෝල්ටාවේ ගිණුම්වල රාජපක්ෂලා දුන්නු සල්ලිත් තියෙනවා

## Mr. President

### යාලට කාර්යාලයක්

ජනපති රනිල් වික්‍රමසිංහ ඉකුත් සතියේ සෙනසුරාදා යාලට ගියේ නව අයෝජනයක් වූ තරු පන්තියේ හෝටලයක් විවෘත කිරීමටය. එහිදි නියඟයෙන් පීඩාවට පත් යාල වනෝද්‍යානයේ වන සතුන් වෙනුවෙන් කෘත්‍රිම පොකුණු සාදා ජලය රඳවන අවස්ථාවක් නිරීක්ෂණය කිරීමට ද ඔහුට අවස්ථාව උදාවූවේය.

සංචාරක ඇමති හරීන් ප්‍රනාන්දු මෙන්ම ඇමරිකානු තානාපතිනි ජූලි චන්ග් ද මේ අවස්ථාවට එක්වූ අතර ජනපති කීවේ සංචාරක කර්මාන්තය නඟා සිටුවීමට හැකි ප්‍රධානතම අවස්ථාවක් වන වනාන්තර හා වන සතුන් සුරැකීමට කටයුතු කළ යුතු බවයි.

නිතර යාලට යන විපක්ෂ නායක ගැන කියූ කතාවක් නිසා හරීන්ට සිනහව නතර කර ගත නොහැකි විය. අසල සිටියවුන් ඒ ගැන විමසද්දී හරීන් කීවේ අපි විපක්ෂ නායක කාර්යාලය යාල ඉදිකිරීමට සැලසුම් කරන බවය.

තරු පන්තියේ හෝටලය විවෘත කරමින් සංචාරක ක්ෂේත්‍රයේ නව අවස්ථා ගැන සිහිපත් කළ ජනපති එය අවසන් කොට පැමිණියේ සිය සිංගප්පූරු සංචාරය සඳහා සූදානම් වීමටය. ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානි සාගල රත්නායක ජනපති අමතා විමසුවේ එල්.පී.එල්. අවසන් මහා තරඟය බෙත්තාරම ක්‍රීඩාංගණයේ පැවැත්වෙන බැවින් එහි යාමට වේලාවක් තිබේද යන්නයි.

### ජනපතිට ලැබුණු චියර් එක

ඊට කැමැත්ත පළ කළ ජනපති රනිල් බෙත්තාරාම ක්‍රීඩාංගණයට පැමිණෙන තුරු ක්‍රිඩාලෝලීන් කිසිවෙකුත් ඒ ගැන දැන සිටියේ නැත. ජනපති සිටින තැන ක්‍රීඩාංග ණයේ කැමරා ශිල්පීන්ට රූපගත කරගත නොහැකි බව දැනගත් ජනපති මාධ්‍ය අංශයේ නිලධාරීන් ඔවුන්ට වහාම එම අවස්ථාව උදා කර දුන්නේය.

ක්‍රීඩාංගණයේ සවිකළ පුළුල් රූපවාහිනි තිරමත ජනපති තරඟය නරඹන දර්ශන විකාශය වෙද්දී තරඟ නිවේදකයන් ද ඒ ගැන ප්‍රකාශ කළ අතර ඊට ක්‍රීඩාලෝලීන්ගෙ න් පළවූවේ වෙනස්ම ප්‍රතිචාරයකි. ඔවුන් සිය ජංගම දුරකතනයන්හි "ප්ලෑෂ් ලයිට්" දල්වා ආලෝක ධාරා ප්‍රදර්ශනය වන ලෙස තාලයකට දෑත් වනන්නට වූහ. විනාඩියක පමණ කාලයක් මෙය ප්‍රේක්ෂකාගාරය වෙතින් දක්නට ලැබුණේය.

ක්‍රීඩා රාජ්‍ය ඇමති රෝහණ දිසානායක, ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානි සාගල රත්නායක, ක්‍රිකට් ආයතනයේ සභාපති ෂම්මි සිල්වා ක්‍රීඩාංගණයේ විශේෂ අමුත්තන්ගේ මැදිරියේ සිට තරඟය නරඹද්දී පකිස්ථානයේ හිටපු ක්‍රිකට් නායක වසීම් අක්‍රම් ද ජනපති අසලට පැමිණ කතා බහ කරන්නට වූහ. ජනපති ක්‍රිකට් ආයතනයේ නිලධාරීන් හා ක්‍රිඩා රාජ්‍ය ඇමති සමඟ එල්.පී.එල්. තවදුරටත් දියුණු කිරීම ගැන සාකච්ඡා කළේය. පැයකට ආසන්න කාලයක් තරඟය නැරඹූ ජනපති රනිල් ඉන් පිටව යද්දී කාර්ය මණ්ඩල ප්‍රධානි සාගල අසලට පැමිණි ක්‍රිකට් ආයතනයේ නිලධාරියෙක් අමුතු කතාවක් කීවේය.

"ජනාධිපතිතුමා එනවා කිව්වම අපි ටිකක් බයවෙලා හිටියේ. මොකද තරඟ නරඹන්න ආපු ජනාධිපතිවරුන්ට ප්‍රේක්ෂකයෝ හූ කියපු කාලයකුත් තිබුණානේ. නමුත් මේ ජනාධිපතිතුමාට ලැබුණේ හිතාගන්න බැරි චියර් එකක්." නිලධාරියා කියද්දී "දැන් තත්ත්වය වෙනස් ක්‍රීඩාලෝලීන් දන්නවා විනාශ වූ රට ගොඩ ගන්නේ මේ ජනාධිපතිතුමා කියලා." සාගල පිළිතුරු දෙමින් පිටව ගියේ නිලධාරියාගේ පිටට ද තට්ටුවක් දමමිනි.

### සිංගප්පූරුවේ සහය

සඳුදා අළුයම පිටත් වූ ගුවන් යානයකින් සිංගප්පූරුවට පැමිණි ජනපති ඇතුළු පිරිසට හිමිවූවේ ඉහළ පිළිගැනීමකි. කාර්ය මණ්ඩල ප්‍රධානි සාගල රත්නායක, දේශගුණික විපර්යාස පිළිබඳ ජ්‍යෙෂ්ඨ උපදේශක රුවන් විජයවර්ධන, ආර්ථික කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ උපදේශක ආචාර්ය ආර්.එස්.එච්. සමරතුංග, ජාත්‍යන්තර කටයුතු අධ්‍යක්ෂ



දිනුක් කොළඹගේ හා පෞද්ගලික ලේකම් සැන්ඩ්‍රා පෙරේරා ද ගමනට එක්ව සිටියහ.

කෙටි සංචාරයක් වුවද රටට වැදගත් කාරණා ගණනාවක් ගැන මෙහිදි සාකච්ඡා කරනු ලැබීය. බලශක්ති ක්ෂේත්‍රය, දේශගුණික විපර්යාස පිළිබඳව මෙන්ම අතහැරුණු සිංගප්පූරු - ශ්‍රී ලංකා වෙළෙඳ ගිවිසුම ගැනද මෙහිදි සාකච්ඡා කළෝය. ඊට අමතරව ඉන්දියන් සාගරයේ ආරක්ෂාව ගැන මෙන්ම නිපුණතාවය සහිත ශ්‍රමිකයන් සිංගප්පූරුවට යැවීම ගැන ද කතා බහට ලක් විය.

ජනපති ඇතුළු කණ්ඩායම මෙහිදි සිංගප්පූරු ජනාධිපතිනි හලීමා යෙකුබ්, සිංගප්පූරු ආරක්ෂක ඇමති ආචාර්ය නෙං එං හෙන්ග්, තිරසර හා පරිසර ඇමතිනි ග්‍රෙස් ෆු හායි ඉයෙන් හා අග්‍රාමාත්‍ය ලී සියෙන් ලූන්ග් මුණ ගැසී සාකච්ඡා කළේය. කාබන් හර කිරීමට අදාළ ගිවිසුමකට ද මෙහිදි අත්සන් තැබීනි.

ජනපති රනිල් ඇතුළු පිරිසට දිවා භෝජන සංග්‍රහයක් පිරිනැමුවේ එරට විදේශ ඇමති හා ස්වදේශ කටයුතු සහ කම්කරු අමාත්‍යවරයා විසිනි. වසරක් තුළ ශ්‍රී ලංකාව වෙනස් කළ ආකාරය ගැන ජනපති පැසසුමට ලක් කළ ඔවුන් එය ලෝකයටම ආදර්ශයක් බව කීවෝය.

ශ්‍රී ලංකාව සමඟ යළි සම්බන්ධතා තහවුරු කර ගැනීමට තම රට කැමැත්තෙන් සිටින බව ද සිංගප්පූරු නායකයෝ ජනපති හමුවේ ප්‍රකාශ කළහ. සාර්ථක දෙදින නිල සංචාරය අවසන් කළ ජනපති රනිල් ඇතුළු දූත පිරිස අඟහරුවාදා රාත්‍රියේ මෙරටට පැමිණියෝය.

පැරිස් සමුළුවට අනුව කාබන් හර කිරීම සම්බන්ධයෙන් සිංගප්පූරු රජය සමඟ ඇති කරගත් ගිවිසුම් ගැන සාකච්ඡා කිරීමට ජනපති රනිල් පසුදාම පරිසර අමාත්‍යාංශයේ නිලධාරීන් හා දේශගුණික විපර්යාස පිළිබද ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක රුවන් විජයවර්ධන ඇතුළු එම කාර්යාලයේ කණ්ඩායම ජනාධිපති කාර්යාලය වෙත කැඳවනු ලැබීය.

### දේශගුණික ප්‍රශ්නයට විසඳුම්

"අපි නියඟයකට මුහුණ දෙනවා. ඉදිරියේදි ගංවතුර තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්. මේ දෙකම මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවෙන දේශගුණික විපර්යාස. අපි මේකට මුහුණ දෙන්න දේශගුණික විපර්යාස කාර්යාලය ඇති කරන්න ඕනා." ජනපති රනිල් කතාව ආරම්භ කළේ එලෙසිනි.

"ජනාධිපතිතුමා දේශගුණික විපර්යාස සමුළුවට යනකොටත් විපක්ෂයේ සමහර පක්ෂ නායකයෝ ඇහුවා මොකටද යන්නේ කියලා. සමහරු මටත් හිනා වුනා දේශගුණික විපර්යාස උපදේශකකම ගත්තා කියලා. නමුත් ජනාධිපතිතුමා එදා ගත්තු පියවර අද ඇස් ඉදිරිපිටම නිවැරදි දෙයක් බවට තහවුරු වෙලා තියෙනවා." ජනාධිපති උපදේශක රුවන් විජයවර්ධන ජනපති කතාවට උණ පූරණයක් එක් කළේය.

දේශගුණික විපර්යාස ඇකඩමියක් ඉක්මණින් ආරම්භ කිරීම, දේශගුණික විපර්යාස විශ්වවිද්‍යාලයක් ආරම්භ කිරීම ගැන ද මෙහිදි සාකච්ඡා වූවේය. දේශගුණික විපර්යාස නිසා ගැටළු මතුව තිබෙන ආසියානු රටවල් එකතුවී දේශගුණික විපර්යාස යුක්ති සංසදයක් නිර්මාණය කළ යුතු බවද ජනපති අවධාරණය කළේය. එසේම මෙරට කැළණි නදී සීමාවේ වාර්ෂිකව ඉහළ යන අපවිත්‍රතාවය ගැන ද මෙහිදි සාකච්ඡා කරනු ලැබීය.

මෙරටට පත්ව ආ නව මහ කොමසාරිස්වරයෙකු හා තානාපතිවරුන් දෙදෙනෙකුගේ අක්තපත්‍ර පිළිගැනුනේ එදින පෙරවරුවේය.

ජනපති පාර්ලිමේන්තු කටයුතු උපදේශක මහචාර්ය ආශු මාරසිංහ හා ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරු පිරිසක් බදාදා සවස ජනපති මුණ ගැසුණේ පාර්ලිමේන්තු කටයුතු ගැන සාකච්ඡා කිරීමටය. එදින පෙරවරුවේ සභාවේ දි විපක්ෂයේ අශෝභන හැසිරීම ගැන ද කතා බහට ලක්විනි.

### නමට විපක්ෂ නායක

"විපක්ෂය පාර්ලිමේන්තුවේදී ආණ්ඩුවේ වැඩවලට බාධා කරනවා. කිසිම වැඩක් කරන්න දෙන්නේ නෑ. ජනතාවට වැදගත් පනත් ගේන්න දෙන්නේ නෑ." ඒ පැමිණිල්ල ඇමති ප්‍රසන්න රණතුංගගෙනි.

"ප්‍රශ්නවලට තියෙන පළවෙනි පැය ඇදගන්නවා පැය දෙක තුනකට. එතකොට අනෙක් වැඩ කර ගන්න වෙන්නේ නෑ." ආශුද කතාවට එක්වූවේ එලෙසිනි.

"අනෙක් අතට විපක්ෂයේ මන්ත්‍රීවරු විපක්ෂ නායකතුමාට කන්ට්‍රෝල් නෑ කියලා අද වැඩෙන් ඔප්පු වුනා. විපක්ෂය කිසිම උපක්‍රමයකින් තොරව නිකං කාලේ කා දමන ගමනක් යන බව තමයි පේන්නේ." මන්ත්‍රී මධුර විතානගේ කීවේය.

"සභානායකුමයි අගමැතිතුමයි ආණ්ඩු පක්ෂය කන්ට්‍රෝල් කරගෙන යනවා. හැබැයි විපක්ෂ නායකතුමාගෙන්
ඒක වෙන්නේ නෑ. ඔබතුමා විපක්ෂ නායක ඉන්න කාලේ ඒ පාලනය තිබ්බා." ඇමති ප්‍රසන්න තවත් කරුණක් පෙන්වා දුන්නේය.

"විපක්ෂය ගැන අපිට කරන්න දෙයක් නෑ. නමුත් පාර්ලිමේන්තුවේ කාලය කළමනාකරණය ගැන පක්ෂ නායක රැස්වීමේදි තීන්දුවක් ගන්න. ඒක පාර්ලිමේන්තුවේ 225ට ලිඛිතව දැනුම් දෙන්න. ජනපතිගේ පිළිතුර එය විය.

බ්‍රහස්පතින්දා පෙරවරුවේ ජනපති ත්‍රිකුණාමලය බලා පිටත්ව යාමට නියමිතව තිබුණත් ඊට පෙර ඔහු තවත් හමුවීම් කිහිපයකට වේලාව වෙන් කර ගෙන තිබුනි. දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමට යාමට පෙර ජනාධිපති කාර්යාලයේදි මැති ඇමතිවරු කිහිපදෙනකු මුණ ගැසුණේ රටේ දේශපාලන, ආර්ථික තත්ත්වය ගැන කතා කිරීමටය.

"දුමින්ද නාගමුව මෝල්ටාව ගැන කරපු කතාවට අනුර දිසානායකගෙන් කිසිම ප්‍රතිචාරයක් නෑ. හැබැයි සාගර කාරිවසම්ටයි, තිස්ස කුට්ටිටයි නම් එන්තරවාසි යවලා." මහාචාර්ය ආශු කීවේ කට කොනකට සිනහවක්ද නගාගෙනය.

### මෝල්ටා ගිනුමේ සල්ලි කාගෙද?

"අපේ ටිරාන් අලස් ඇමතිතුමා නම් සිද්ධිය ගැන හොයන්න සී.අයි.ඩී. එකට දීලා තියෙනවා. හැබැයි අනුර දිසානායක මේ කාරණය ගැන මුකුත්ම කරලා නෑ. අඩුගානේ පාර්ලිමේන්තුවේදීවත් මේ ගැන කතා කළේ නැනේ." ඇමති චාමර සම්පත් ද කතාවට එකතු වූවේය.

"ලෙටර් ඩිමාන්ඩ් යවලා නඩු විභාග කරලා තීන්දුවක් එන කොට අවුරුදු 10ක් විතර යයි. මෝල්ටාවේ ගිණුම්වල ඔය සල්ලි විතරක් නොවෙයි රාජපක්ෂලා දුන්නු සල්ලිත් තියෙනවා කියලා ආරංචියක් තියෙනවා." මන්ත්‍රී වජිර අබේවර්ධන කියද්දී සැමට සිනහව නතර කර ගැනීමට නොහැකි වූහ.

"අපි හිනාවුනාට එතනත් ගන්න දෙයක් නැතුවාම නොවෙයිනේ. යහපාලන ආණ්ඩුව කාලේ දාපු දූෂණ මර්ධන කාර්යාලයේ ප්‍රධානියා වුනේ ආනන්ද විජේපාල කියලා කෙනෙක්. එතුමා පසුගිය මැතිවරණයේදි ජාතික ජන බලවේගයේ ප්‍රධානියෙක් විදියට එළියට ආවා. දූෂණ මර්ධන කාර්යලය තිබුණේ එයා යටතේ." මධූර විතානගේ මන්ත්‍රීවරයා ද කතාවට සම්බන්ධ වූවේ එලෙසිනි.

"ඔව් දූෂණ මර්ධන කාර්යාලයේ හිටපු වැලිඅමුණ රටින් පිටවෙලා ගියා. ජයම්පති වික්‍රමරත්නත් රටේ නෑ. දූෂණ මර්ධන කාර්යාලය කියපු නිසා පැමිණිලි විභාග කළ රහස් පොලිසියේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකරට නඩු වැටුනා. නමුත් ආනන්ද විජේපාල එළියේ ඉන්න එක හිතන්න ඕන කාරණයක්." ප්‍රේමනාත් සී. දොලවත්ත මන්ත්‍රීවරයා ප්‍රශ්නයක් මතු කළේය.

"ඔබතුමන්ලට දැන් කරන්න තියෙන හොදම වැඩේ, දැන් මේ සිද්ධිය හොයන්න කියලා ටිරාන් අලස් ඇමතිතුමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට බාරදීලා තියෙන නිසා ඔබතුමන්ලට තියෙන්නේ ඔය කියන කාරණය ගැනත් පරීක්ෂා කරන්න කියලා ඇමතිතුමා හරහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලන එක." මහාචාර්ය ආශු කතාව අවසන් කළේ එලෙසිනි. මේ සියල්ල සාවධානව අසා සිටියද ජනපති රනිල් කිසිවක් කීවේ නැත. අවසානයේ මන්ත්‍රීවරුන් පිරිස සාකච්ඡා කළේ ඉදිරි සතියේදි ඉහත කාරණය ගැන ටිරාන් අලස් ඇමතිවරයා දැනුම්වත් කිරීමටය.

ජනපති රනිල් එදින ඉන්දියන් අගමැති මෝදිට විශේෂ පණිවුඩයක් යවමින් සඳ මතට ගිය හතරවෙනි රාජ්‍ය වීම ගැන සුබපැතුම් එක් කළේය.

Mediaman

# Brain Drain vs Brain Gain



රටේ සිටින උගතුන් බුද්ධිමතුන් රට හැර යෑම ගැන විපක්ෂය මෙන්ම වෘත්තිකයන් විද්වතුන් ආදීන් විසින්ද මහා හීතිකාවක් මවමින් තිබේ. මීට ප්‍රතිවිරුද්ධ අදහස් දරණ සමහරුන් මේ ගැන ප්‍රශ්න කරන්නේ මේ අය රටේ හිටියා කියා රට දියුණු වුණාද යනුවෙනි. තවත් සමහරුන් කියන්නේ මේ ප්‍රවණතාවය හොඳ බවත් මෙය රටට ප්‍රතිලාභ ගෙන දෙන වැඩක් ලෙස තවදුරටත් ප්‍රවර්ධනය කළ යුතු බවය. කොහොම නමුත් රටේ මේ වන විට පවතින දේශපාලන ආර්ථික සමාජීය ගැටළු මධ්‍යයේ මෙය සංවේදී මාතෘකාවකි.

මෙරට රජයෙන් දෙන නොමිලයේ අධ්‍යාපනය, නොමිලයේ සෞඛ්‍ය ප්‍රතිලාභ සහ අනෙකුත් පහසුකම් අත්පත්කර ගැනීම මඟින් ගොඩනැගෙනන්ට වරම් ලැබුණු පිරිස් එම හැකියාවන් පාවිච්චි කරමින් හෝ නොකරමින්, විදේශ රැකියා, විදේශයන්ගේ ස්ථිර පදිංචිය සඳහා යෑම අද ඊයෙක සිදු වන දෙයක් නොවේ. බුද්ධිගලනය යනුවෙන් වර්ග කරන කොටසට වැටෙන ආකාරයේ වෘත්තිකයන්ගේ විදේශ ගත වීම් (ස්ථිර පදිංචිය සඳහා හෝ දීර්ඝ කාලීනව හෝ) රටට අලුත් දෙයක් නොවේ. මෑතකදී එය වර්ධනය වූ බව පසුගිය වසරේ සංඛ්‍යා ලේඛන හෝ මෙම වසර තුළ වාර්තා වෙමින් තිබෙන පුවත් අනුව පෙන්වා දීම සිදුවෙමින් පැවැතියත් සමස්තයක් ලෙස බැලූ විට තත්වයන් සාමාන්‍යය. පසුගිය වසරට පෙර වසර දෙක තුළදී කොවිඩ් වසංගත තත්වයන් නිසා විදේශ සංක්‍රමණයන්ට අදාලව තිබුණු තහංචි මත එම වසරවල විය යුතුව තිබුණු සංක්‍රමණයන් පසුගිය වසර සහ මෙම වසර තුළදී සිදුවීම් මත මෙම එම ඉලක්කම වැඩි අගයක් පෙන්නුම් කිරීම සිදුව තිබේ. නමුත් පෙර වර්ෂවලට වඩා යම් වැඩිවීමක් වී ඇති බව පිළිගත හැකිය.

කෙසේ නමුත් විශේෂයෙන්ම වෘත්තිකයන්ගේ ස්ථිර විදේශ ගතවීම ගැටලුවක් වන්නේ එහිදී පුරප්පාඩු වන මෙරට වෘත්තිමය අවස්ථා පිරවීමට රජය අසමත් වන්නේ නම් පමණි. පසුගිය වසර කිහිපය ගෙවුණේ මෙරට වෘත්තීමය සුදුසුකම් සැපුරූ අයට පවා වෘත්තීමය අවස්ථා හිඟවීමකි. රටේ ආර්ථික අර්බුදය හමුවේ වෘත්තික ආදායම් පහළ යෑම මෙන්ම ඔවුන්ගේ ජීවන තත්වයන්ට සාපේක්ෂව වියදම් ඉහළ යෑම ආදී ගැටළු නිසාත් විදේශ ගතවීමට යම් වැඩි ප්‍රවණතාවයක් පෙන්වා තිබේ. නමුත් මේ නිසා වන ගැටළුකාරීත්වය තාවකාලික තත්වයකි. රටේ අවශ්‍යතාවයට ප්‍රමාණවත් තරම් වෘත්තිකයන් හිඟ අවස්ථා මේ රට ඕනෑ තරම් පසුකර ඇත. රට අර්බුදයට ගියේ මෙවැනි හේතු මත නොවේ. ඇතැම් වෘත්තිකයන්ගේ සහ වියතුන්ගේ අනවශ්‍ය මැදිහත් වීම නිසාය. කෙසේ නමුත් පෙර තිබූ උනන්දුවද දැන් අවම වෙමින් පවතී. මන්ද යත් විදේශ වෘත්තීමය අවස්ථා සුලබ වුවද එය ලබාගැනීමට අවශ්‍ය සුදුසුකම් සපිරි වෘත්තිකයන්ගේ අවම බව හෝ ඒ සඳහා යොමුවීමට ඇති අනෙක් අපහසුකම් නිසාය. රටින් පිටවීමට කැමති වුවත් ඒ සඳහා හැකියාවන් සම්පූර්ණ කරගැනීමට බොහෝ අයට හැකියාව සීමාසහිතය. එසේම මෙහිදී විදේශ ගතවීම් සිදුවන තරමක් වන්නේ විය හැකි අවදානම් නැතිනම් අපහසුකම් දරා ගැනීමේ ශක්තිය ඇති අය පමණි. අනෙක් කරුණ බුද්ධිගලනය කියා මෙම විදේශ ගත්වීම් හැඳින්වුවත් බොහෝ විටම සිදු වන්නේ බුද්ධිය, දැනඋගත්කම්, වෘත්තිය පසෙක තබා කුමක් හෝ රැකියාවක් අපේක්ෂාවෙන් වන විදේශ ගතවීම්ය. ඉංග්‍රීසි භාෂාවෙන් Brain Drain යනුවෙන් හඳුන්වන් තත්වයකි. එනම් බුද්ධිය අහක යෑමය. තම මව් රටටත් සංක්‍රමණික රටටත් අහිමි වන තත්වයකි.

කොහොම නමුත් අද ලෝකය පුරාම වෘත්තිකයන්ට ඇත්තේ ඉහළම ඉල්ලුමකි. විශේෂයෙන්ම සංවර්ධිත රටවල තිබෙන ඉල්ලුම සපුරාලන්නට ලෝකය සමත්ව නැත. ඉහළ වැටුප් වරප්‍රසාද ලබාදෙනවා කිව්වත් එම අවස්ථා පූර්ණ කරගැනීමට එම විදේශීය රටවලටත් අපහසුව තිබේ. නමුත් එම රාජ්‍යයන් හෝ තමන්ගේ රටේ පුරවැසියන්ගෙන්, තමන්ගේ අධ්‍යාපන ආයතනවලින් හෝ මේ අඩුව පුරවා ගැනීමටද සමත් නැත. ප්‍රධාන හේතුව වන්නේ වෘත්තිකයකු ගොඩනැගීම වෙනුවෙන් දරන්න වන වියදම ඉතා ඉහළ වීමය.

මේ ගැන වන වාර්ථාවකින් (https://blog.medlinkstudents.com/how-much-does-it-cost/) කියැවුණේ බ්‍රිතාන්‍යයේ වෛද්‍ය උපාධියක් ලැබීමට වසර 6ක පුහුණු කාලයට අවම බ්‍රිතාන්‍ය පවුම් 127,500ක් පමණ වැය වෙන බවය. එනම් රුපියල් මිලියන 52කට අධික මුදලකි. නොමිලයේ විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් එහි නැත. නමුත් රජය ඒ වෙනුවෙන් ණය මුදලක් ලබා දෙයි.

බ්‍රිතාන්‍යයේ වයස අවුරුදු 20 දී වෛද්‍ය උපාධිය හදාරණ ශිෂ්‍යයන්ට තම වෘත්තීය ජීවිතය තුළ වයස අවුරුදු 50 වන තුරුම ශිෂ්‍ය ණය පියවන්නට සිදුවන අවස්ථා තිබේ. එනම් මසකට රුපියල් දෙලක්ෂයකට ආසන්න මුදලකි.

එහෙත් මෙරට වෛද්‍ය උපාධිය දක්වා සියල්ල නොමිලයේ ලැබේ. රජයේ රැකියාවද විශාල වරප්‍රසාද ප්‍රමාණයකුත් ලැබේ. රජයේ රැකියාව අතරතුර පෞද්ගලික අංශයේ රැකියා, ව්‍යාපාර කිරීමේ අවස්ථාවද හිමිය.

වියදම් අධික බව නිසා සංවර්ධිත රටවල වෘත්තීමය සුදුසුකම් සපුරා ගැනීමට පිවිසෙන ප්‍රමාණය අඩුවන අතර රජයන්ද ඒ වෙනුවෙන් උනන්දු නොවේ. මෙම අඩුව පුරවා ගැනීම වෙනත් රාජ්‍යයන්වලින් බිහිවන වෘත්තිකයන්ගෙන් අපේක්ෂා කරයි. එය ඔවුන්ට ලාබදායකය. පහසුය.

එසේම එම රටවල විශිෂ්ටතම වෘත්තිකයන් පවා විශාල වශයෙන් වෙනත් රාජ්‍යයන් කරා සංක්‍රමණය වීමද අලුත් තත්වයක් නොවේ. මේ නිසා සීමාසහිත පුරවැසි වෘත්තික ප්‍රමාණය මත සැබවින්ම බුද්ධිගලනය පිළිබඳ සැබෑම ගැටළුව ඇත්තේ ඔවුන්ටය. නමුත් මේ රටවල විපක්ෂය හෝ වෘත්තීය සමිතිකාරයන් බුද්ධිගලනය නවත්වන්න බැරි ආණ්ඩුවක් මොකටද කියා ලංකාවේ මෙන් ඩෙගා නටන්නේ නැත. විදේශිකයන්ට, විජාතිකයන්ට වෘත්තීමය අවස්ථා ලබා දෙනවා කියා, රටේ එකාලට අවස්ථා නැතිවෙනවා කියා පිස්සු කෙළින්නේද නැත. පවතින ප්‍රශ්නය කුමක්ද යන්න හඳුනාගෙන ඊට ඇති විකල්ප විසඳුම් යෝජනා කර ප්‍රශ්නය රටට වාසි වන විදිහට විසඳා ගැනීමට තරම් එම රටවල දේශපාලනඥයන් පරිණතය, වෘත්තීය සමිති පරිණතය.

පසුගිය සතියේ අප චැතම් ස්ට්‍රීට් ජර්නල් පුවත්පත මඟින් වෛද්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් තිබෙන ගෝලීය අර්බුදය ගැන අණාවරණයක් කළෙමු.

> මෙම QR බේතය Touch කිරීමෙන් හෝ Scan කිරීමෙන් "දොස්තරලාගේ රට බයිලා වැඩක් නැත - රට සුවෙනි" ලිපිය කියවිය හැකිය

කෙසේ නමුත් මෙරට පවතින තත්වයන් හමුවේ වෘත්තීය අවස්ථා වෙනුවෙන් විදේශ ගතවීම් ඉදිරියටත් සිදුවෙනු ඇත. එය වැලක්විය නොහැකිය. මෙහිදී අවධාරණය කළ යුතු වැදගත් කාරණයක් වන්නේ මෙරට වෘත්තිකයන් රට හැර යන්නේ අමරිකාව, යුරෝපය, ඕස්ට්‍රේලියාව වැනි රටවලට පදිංචියට බවට මතයක් තිබුණත් සත්‍යය එය නොවේ. සාතිශය බහුතරය රැකියා සඳහා ගොස් ඇත්තේ මැදපෙරදිග රටවලටය. සංවර්ධිත රටකට කියා වැඩිම පිරිසක් ගොස් ඇත්තේ ජපානයටය. 2022 වසරේ 14,000ක් පමණ වෘත්තකියන් අතරින් 9,000ක් පමණ මැදපෙරදිග රටවලටත්, 2,000ක් පමණ ජපානයට ගොස් ඇත. මාලදිවයිනට සහ සිංගප්පූරුවට දහසකට ආසන්න ප්‍රමාණයන්ගෙන් ගොස් ඇත. මේ අනුව ඉතාම පැහැදිලි ඇත්ත නම් මේ බොහෝ පිරිස තාවකාලිකව වැඩි මුදලක් උපයාගැනීම වෙනුවෙන් විදේශ රැකියා සඳහා ගොස් ඇති බවය. වසර කිහිපයකින් මේ අය නැවත මෙරටටම පැමිණේ. බුද්ධිගලනය කියන්නේ මෙය නොවේ. මේ ශ්‍රම සංක්‍රමණයන්ය.

කොහොම නමුත් වෘත්තිකයන් විදේශ ගතවීමේ ප්‍රවණතාවය රටට වඩා වාසිදායක ලෙස විසඳා ගැනීමට රජය සමත් විය යුතුය. තුට්ටු දෙකේ මෝඩ දේශපාලනයක් කරමින් රටේ නැති අර්බුද මවමින් තමන්ගේ පටු දේශපාලනික වුවමණාවන් වෙනුවෙන් ඒවා පාවිච්චි කර රටට කෙළවීම විපක්ෂය සිදු නොකළ යුත්තකි. අද රට ඉල්ලා සිටින්නේ සියලු දෙනාගේ එකඟත්වයකින් අර්බුදයට සැබෑම විසඳුම ක්‍රියාත්මක කිරීමය. එමෙන්ම සඳහන් කළ යුතු තවත් වැදගත් කාරණයක් වන්නේ පසුගිය වසර තුළ 14,000ක පමණ වෘත්තිකයන් විදේශ ගතවීම හීතියට ලක්වන කරුණක් ලෙස හුවා දැක්වූවත් සත්‍ය වශයෙන්ම මෙරට රාජ්‍ය සහ වැඩිමනත්ම පෞද්ගලික විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවලින් වාර්ෂිකව විවිධ අංශවල වෘත්තිකයන් ලෙස කටයුතු කළ හැකි සුදුස්සන් 70,000කට අධික පිරිසක් මෙරටට දායාද කරන බවය.

පවතින යථාර්ථය පිළිගනිමින් අනාගතය වෙනුවෙන් සූදානම්වීම, ජනාධිපති රනිල් වික්‍රමසිංහ විසින් මේ වන විට ගනිමින් තිබෙන පියවර අනුව පෙන්නුම් කර තිබේ. විශේෂයෙන්ම මෙරට වෘත්තිකයන් විදේශ රැකියා හඹායෑම ගැන ඔහු දැනුවත්ය. ඒ හරහා රටට සිදුවිය හැකි බලපෑම ගැනද වෘත්තීය සමිතිකාරයන්ට වඩා දැනුවත්ය. නමුත් එසේ කියා මේ තත්වයන් දැඩි නීතිරීති දමා පාලනය කර විදේශ ගමන් තහනම් කරන තැනකට ඔහු පත්ව නැත. එසේම මේ නැති අර්බුද මවමින් වැඩි වැටුප්, වරදාන, වරප්‍රසාද, බදු සහන දිනා ගැනීමට මාන බලන තක්කඩි වෘත්තීය සමිතිකරයන්ගේ බොරු බේගල්වලටද ඔහු හසුවන්නේ නැත. හදිසි තත්වයන් පාලනය කරගැනීම වෙනුවෙන් කෙටි කාලීනව පියවරයන් ගැනීම සිදුවීම හැකි වූවත් ජනාධිපතිවරයාගේ උත්සාහය මෙම ප්‍රවණතාවය රටට දීර්ඝ කාලීනව වාසිදායක ලෙස බේරා ගැනීමටය. පසුගිය සති කිහිපයේදී අවස්ථා කිහිපයකදී මේ වෙනුවෙන් ගන්නා පියවර ගැන ඔහු අවධාරණය කර තිබිණි. ඒ අනුව අදාල කටයුතු රැසක්ද මේ වන විට ක්‍රියාත්මක කර තිබේ.

කොහොම නමුත් බුද්ධිගලන තත්වයක් ඇතිවීමෙහි මෙහි අනෙක් වාසියක්ද තිබේ. ඒ ශක්තිමත් ශ්‍රී ලාංකීය ඩයස්පෝරාවක් සංවර්ධිත රටවල් ආශ්‍රිතව ගොඩ නැඟීමය. විදේශීය රටවල මර්මස්ථානවල ශ්‍රී ලාංකිකයන් තීරණාත්මක මැදිහත්වීමක සිටින විට එයත් රටට දේශපාලන හා ආර්ථික බලයක් ගොඩනැගීමට දායකවේ. අද ඉන්දියාව චීනය වැනි රාජ්‍යයන් මේ හරහා අත්පත් කරගෙන තිබෙන බලය සුළුපටු නැත. මේ ඩයස්පෝරාවට ඇමරිකාව සහ බටහිර රාජ්‍ය පද්ධතියම කඩා ඉහිරවීමට තරම් බලයක් ඇතැයි කීම අතිශයෝක්තියක් නොවේ. එය බැංකු තැන්පතු එකවර එළියට ඇදගැනීමට තැන්පත්කරුවෝ කටයුතු කළ හොත් බැංකු කඩා වැටීම මෙනි. රටකින් වෙනත් රටකට යන වෘත්තිකයන්, ශ්‍රමිකයන් කියන්නේ රටේ විදේශීය තැන්පතුවකි.

ඒ අනුව ශ්‍රී ලංකාව දැනට සිටිනේ කුඩා තැන්පතුවක් සහිතවය. ඒ නිසා ලැබෙන ප්‍රතිලාභ අවමය. මෙය වැඩි කරගන්නා ක්‍රමය ගැන ජනාධිපතිවරයා කරන අවධාරණය අනුව එය සාර්ථකවීම රට ලබාගන්නා අනාගත ජයග්‍රහණයක් වනු ඇත. ඒ අනාගත රටේ රනිල් වික්‍රමසිංහ නොසිටියත් එදාට සිටින, රාජ්‍ය පාලකයාට රට තවදුරටත් සංවර්ධනය කරගන්න රනිල්ට තරම් මහන්සි වෙන්න දෙයක් නැත. ආර්ථික අර්බුද එන්නේ නැත. අතදිග හැර ජනතාව වෙනුවෙන් සේවය කළ හැකි වෙනු ඇත.

07 පිටුවට

06 පිටුවෙන්

අදත්, හෙට දිනයේත් ලෝකයේ වෘත්තිය අවස්ථා පිරවීම වෙනුවෙන් මෙරට මානව ප්‍රාග්ධනය ගොඩනැංවීම, පවතින තත්වයට වඩා කිහිප ගුණයකින් වැඩි කරගැනීමට අවශ්‍ය පියවර ජනාධිපතිවරයා ගෙන තිබේ.

විශ්වවිද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන සහ මෙරට අධ්‍යාපන ක්‍රමය නූතන ලෝකයේ අවශ්‍යතාවයට ගැලපෙන ලෙස නවීකරණය කළ යුතු බව ඔහු පෙන්වා දෙන්නේ මේ අවස්ථාව ජය ගැනීම වෙනුවෙනි.

නුගේගොඩ අනුලා විද්‍යාලයේ පැවැති උත්සවයකදී ජනාධිපතිවරයා මෙසේ පැවැසීය.

*"...සමාජයට ඔබින අධ්‍යාපන ක්‍රමයක් නැතිව රටක් ඉදිරියට යන්නේ නැහැ. රටක් ගොඩනගන්නට නම් හොඳ අනාගත පරපුරක් ගොඩනැඟිය යුතුයි. අභියෝග ජයගත හැකි අනාගත පරපුරක් නිර්මාණය කිරීමේ මූලික පියවර තැබිය හැක්කේ අධ්‍යාපනයට පමණයි.*

*...අනෙක් කරුණ වන්නේ, ලෝක ආර්ථිකය රඳා පවතින්නේ විද්‍යාව හා තාක්ෂණය මත පදනම් වූ අංශ කිහිපයක් මතවීමයි. කෘත්‍රීම බුද්ධිය, රොබෝ තාක්ෂණය, බලශක්ති ගබඩාකරණය, බ්ලොක් චේන් තාක්ෂණය, ජෙනොම් විද්‍යාව වැනි අංශ කිහිපයක් අද ලෝක ආර්ථිකයට බලපෑම් කරනවා. ඒ සඳහා අපත් සූදානම් විය යුතුයි.*

*මෙම තාක්ෂණයන් සමඟ අනුගතවීමෙන් මෙම ශත වර්ෂය මැද භාගය වන විට ගෝලීය ආර්ථිකයට ඩොලර් ට්‍රිලියන 300ක් 700ක් අතර විශාල වටිනාකමක් එක් වන බව ආර්ථික විශේෂඥයන් පෙන්වා දෙනවා. මෙම ආර්ථිකය සමග තමයි ලෝකය ඉදිරියට යන්නේ. ඒ සඳහා අපත් සූදානම් විය යුතුයි.*

*...අප පළමුව මෙරට අධ්‍යාපන ක්‍රමය වෙනස් කළ යුතුයි. මෙම විෂයයන් සඳහා හැකි තරම් විශ්වවිද්‍යාල ඇති කළ යුතුයි. ඒ වගේම ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව හා හින්දි භාෂාව ගැන දැනුමක් ලබා ගත යුතුයි. එසේ නම් මෙම විෂය පිළිබඳ දැනුම ලබාගත හැකි පාසල් හා උසස් අධ්‍යාපන ආයතන බිහි කළ යුතුයි. ඒ අනුව රාජ්‍ය විශ්වවිද්‍යාලවලට අමතරව රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල ඇති කිරීමට අප සැලසුම් කර තිබෙනවා. මුදල් නිසා අධ්‍යාපනය නවතා දමන්නේ නැතිව සිසුන්ට රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලවල ඇතුළත්වීමට විදේශ රටවල මෙන් සහන ක්‍රමයකට ණය ලබාදීමේ වැඩසටහනක් අප ක්‍රියාත්මක කරනවා.*

*...මේ අධ්‍යාපන ක්‍රමය වෙනස් නොකළහොත් අපට අනාගතයක් නැහැ. අපට ඉදිරියට යා හැක්කේ නව අධ්‍යාපන ක්‍රමයක් සමඟ පමණයි. කර්මාන්ත ශාලා, ගොඩනැඟිලි, මං මාවත් ඉදි කළ හැකි වුවත් අධ්‍යාපන දැනුම නොමැති නම් අනාගතයක් ළඟා කර ගත නොහැකියි. ඒ නිසා නව අධ්‍යාපන ක්‍රමයක් ඇති කර රටට හොඳ අනාගතයක් නිර්මාණය කිරීමට රජයක් ලෙස අප කැපවී සිටිනවා."*

මාතලේ ශාන්ත තෝමස් විද්‍යාල උත්සවයේ දී අවධාරණය කළේ, අවම වශයෙන් ඉංජිනේරුවන් 10,000ක්, වෛද්‍යවරුන් 7,500ක් වැනි පිරිසක් වසරකට මෙරට විශ්වවිද්‍යාල තුළින් බිහි විය යුතු බවය. එසේම වෘත්තීය පුහුණුව ලබන පිරිස තුන් ගුණයකින්වත් වැඩි කළ යුතු සේම තොරතුරු තාක්ෂණ විෂයට ද විශාල ඉල්ලුමක් තිබෙන බවත් එම අවශ්‍යතා අඛණ්ඩව සපයාගත යුතු බවත්ය.

එමෙන්ම ශ්‍රී ලංකා විද්වත් වෘත්තිකයන්ගේ සංගම් සංවිධානයේ වාර්ෂික හමුවේ දී මෙරටට ඇති අභියෝග ගැනත් එය ජයගැනීම වෙනුවෙන් ගන්නා පියවර ගැනත් ජනාධිපතිවරයා පෙන්වා දී තිබිණි.

*"...මේ දිනවල විශාල පිරිසක් රට හැර යනවා. ඔවුන් විදේශගත වන්නේ වඩා හොඳ අනාගතයක් ගොඩනගා ගැනීමේ අරමුණ ඇතිවයි. කෙටි කාලීනව එය හොඳ දෙයක් ලෙස පෙනෙන්නට පුළුවන්. එලෙස රට හැර යන පිරිසෙන් ඇතැම් කොටසක් යමක් උපයාගෙන නැවත රටට පැමිණෙනවා. නමුත් එය එසේ වූ පමණින් ප්‍රශ්න විසඳෙයි කියා නොසිතිය යුතුයි.*

*...අපට තිබෙන තවත් විශාල ප්‍රශ්නයක් වන්නේ මානව ප්‍රාග්ධනය ප්‍රමාණවත් පරිදි නොමැතිවීමයි. අප ඒ වෙනුවෙන් තරුණ තරුණියන් පුහුණු කළ යුතුයි. අපට ඒ වෙනුවෙන් සැලසුම් සහගත වැඩපිළිවෙළක් තිබිය යුතුයි.*

*...රට තුළ නව විශ්වවිද්‍යාල කිහිපයක් ඇති කිරීම පිළිබඳව අප මේ වන විට සාකච්ඡා කරමින් සිටිනවා. කුරුණෑගල තිබෙන යුනිවර්සිටි කොලේජ් එක, විද්‍යා සහ තාක්ෂණ විශ්වවිද්‍යාලයක් බවට පරිවර්තනය කිරීමට සැලසුම් කර තිබෙනවා. පොළොන්නරුවේ පෞද්ගලික විශ්වවිද්‍යාල ආරම්භ කිරීමට අපට මේ වන විට අයදුම්පත් ලැබී තිබෙනවා. අඩුම තරමින් අප විශ්වවිද්‍යාල 04ක් හෝ 05ක් අදාළ ආයතන සමග සම්බන්ධ වී අලුතින් ආරම්භ කළ යුතුයි. ඒ තුළින් මෙම ක්ෂේත්‍රයේ සිදුව තිබෙන හිඟය පියවා ගැනීමට හැකිවනු ඇතැයි මම විශ්වාස කරනවා.*

*...මහනුවර ප්‍රදේශයේ නව විශ්වවිද්‍යාලයක් ආරම්භ කරන ලෙස පසුගිය ඉන්දීය සංචාරයේදී මම චෙන්නායිවල තිබෙන තොරතුරු තාක්ෂණ විශ්වවිද්‍යාලයට (IIT) ආරාධනා කළා.*

*...ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය ( SLIIT) විශ්වවිද්‍යාල ප්‍රමාණය වැඩි කරමින් තිබෙනවා. හරිත විශ්වවිද්‍යාලයත් එහෙමයි. නමුත් එය ප්‍රමාණවත් නැහැ. නව විශ්වවිද්‍යාල සඳහා අයදුම්පත් ලැබී තිබෙනවා. වෛද්‍ය විද්‍යාල සඳහා ද ඉල්ලුම් පත්‍ර ලැබී තිබෙනවා. ලොස් ඇන්ජලීස්වල තිබෙන විද්‍යා හා තාක්ෂණ විශ්වවිද්‍යාල හා ක්වාලාලම්පූර්වල තිබෙන විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට කැමැත්ත පළ කර තිබෙනවා. අවම වශයෙන් විශ්වවිද්‍යාල හතරක් හෝ පහක් ආරම්භ කිරීමට රජයක් ලෙස අප බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා පෞද්ගලික විශ්වවිද්‍යාල දිරිමත් කිරීමේ වැඩපිළිවෙළක් දියත් කර තිබෙනවා. ඒකාබද්ධ සහයෝගීතාවක් තුළ ආර්ථිකය කඩිනමින් ශක්තිමත් කළ හැකියි. අපට මානව ප්‍රාග්ධනය ද අවශ්‍ය වෙනවා."*

මේ අනුව අනාගතය ඉලක්ක කර ජනාධිපතිවරයා ගෙන තිබෙන පියවර මඟින් පැහැදිලි වන්නේ මේ වන විට බුද්ධිගලනය ගැන මතුකරන අර්බුදයට වඩා එයම රටට වාසියක් කරගත හැකි විසඳුම් ඔහු සතුව තිබෙන බවය. එසේම එය රටේ බුද්ධි ජනනය (brain Gain) ගොඩනංවන සහ රටේ අවශ්‍යතාවයට අතිරික්තයක් වන තරමේ විසඳුමකි. එසේම ජනාධිපතිවරයා එතැනින් නතරව නැත. බුද්ධි ජනනය සමඟ රටේ ඇති විය යුතු ආර්ථික පිම්ම වෙනුවෙන් අවශ්‍ය පහසුකම් වර්ධනයද සහ අවස්ථා බිහිකිරීම වෙනුවෙන් ක්ෂේත්‍ර ගනනාවක පියවර රැසක්ද ක්‍රියාත්මක කර තිබේ. මේ අනුව රටේ අනාගතය සුබදායක තැකක තිබෙන බව පැහැදිලිය.

ජයතුංග බණ්ඩාර

# ජනාධිපතිවරණය කඳවුරු දෙකක සටනක්

## සජිත්, ඩලස් පසුපස ඩලස්, අනුර පසුපස



ලබන වසරේ මැද භාගයේදී පැවැත්වෙතැයි අනුමාන කරන ජනාධිපතිවරණය ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ තීරණාත්මක මැදිහත්වීමක් කරනු ඇති බව පැහැදිලිය.

මේ වන විට ජනාධිපති රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරණයට ඉදිරිපත් වීම තහවුරුවන පුවත් සැරි සරමින් තිබේ. ජනාධිපතිවරයා මේ වන විට රට වෙනුවෙන් ඉදිරිපත් කර තිබෙන දැවැන්ත වැඩපිළිවෙල සාර්ථක කරගැනීමට නම් ඔහු නැවත ජනාධිපති ධුරයට පත්වීම විය යුතු බව පැහැදිලි තත්වයකි. එක්සත් ජාතික පක්ෂය ඒ වෙනුවෙන් සූදානම් වන බවත් පෙනෙන්නට තිබේ. එමෙන්ම පොදුජන පෙරමුණේ පිරිසක් ජනපතිගේ සහයටත් තවත් පිරිසක් වෙනත් අපේක්ෂකයකු ඉදිරිපත් කිරීමේ අදහසකත් සිටින බව පෙන්වමින් තිබේ. ඒ කොහොම නමුත් පොදුජන පෙරමුණේ නිමල් ලන්සා, ප්‍රසන්න රණතුංග, මහින්දානන්ද අලුත්ගමගේ ප්‍රමුඛ කණ්ඩායමක් එම පක්ෂයේ බහුතරයක් දෙනා දිනාගනිමින් නව දේශපාලන සංධානයක් ගොඩ නැගීමේ කටයුතු සාර්ථක කරගනිමින් තිබෙන අතර එහි සහය නිශ්චිතවම ජනාධිපතිවරයාට ලැබෙනු ඇතැයි පෙනෙන්නට තිබේ. එම සන්ධානයට විපක්ෂයේ සෙසු පක්ෂ ගණනාවක ප්‍රබලයන්ද එකතුව සිටින බවත් දැන ගැනීමට තිබේ.

මේ අතර විපක්ෂ නායක සජිත් එළඹෙන ජනාධිපතිවරණයට විපක්ෂයේ පොදු අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වන බවට සජබයේ මන්ත්‍රීවරු ප්‍රකාශ කරමින් තිබෙන නමුත් සජිත් ප්‍රේමදාස එවැනි නිශ්චිත ප්‍රකාශයක් මෑතකදී කර නැත. සජිත් මේ වන විට පොදුජන පෙරමුණට සම්බන්ධව සිටි වියත්මග, ජී.එල්. - ඩලස් කණ්ඩායම, ශ්‍රී ලනිපය හා තවත් කොටස් සමග විපක්ෂයේ සංධානයක් ගොඩ නැගීම ගැන බලාපොරොත්තු තබාගෙන ඒ වෙනුවෙන් සාකච්ඡා වට ගණනාවක් සිදු කරමින් තිබේ. මෙහිදී දේශපාලන ආරංචි මාර්ග පවසා සිටින්නේ ඉදිරි ජනාධිපතිවරණය සඳහා සජිත් ප්‍රේමදාස ඉදිරිපත් නොවී ඒ වෙනුවෙන් ඩලස් අලහප්පෙරුම ඉදිරිපත් කිරීමේ සැලැස්මක් ගැන සාකච්ඡා වන බවය. සජිත් අගමැති අපේක්ෂකයා වීමේ සූදානමක පසුවන බවත්ය. කෙසේ නමුත් එම සාකච්ඡා මෙතෙක් සාර්ථකව නැත. එහෙත් සජිත්ගේ සමීපතම අනුගාමිකයන්ගේ බලාපොරොත්තුව සජිත් අපේක්ෂකයා කිරීමය. පසුගියදා සජබයේ හර්ෂණ රාජකරුණා මන්ත්‍රීවරයා නිශ්චිත ලෙස ප්‍රකාශ කර තිබුණේ සජිත් ඉදිරිපත් වන බවය. මෙය සජිත්ට කරන බලපෑමක්ද විය හැකිය. ඒ අතර සජබයේ සරත් ෆොන්සේකාද සජබයෙන් ඉවත් වුණු පාඨලී චම්පිකද ජනාධිපති සිහිනයක සැරිසරමින් සිටී. මේ තත්වය මත මේ වන විටත් සජබය කණ්ඩායම් කිහිපයකට වෙන්වී සිටින අතර බහුතරයක් දෙනා ජනපති රනිල්ට සහය දැක්වීමට ඉදිරිපත් වෙනු ඇති බවද දේශපාලන ආරංචි මාර්ග පවසයි. ඒ අනුව සජබය යනුවෙන් ශක්තිමත් කණ්ඩායමක් මේ වන විටත් නොපවතින බව පැහැදිලිය.

එමෙන්ම ජාතික ජන බලවේගය වෙනුවෙන් අනුර කුමාර දිසානායක ඉදිරිපත් වන බවත් තහවුරුව තිබේ. අනුර කුමාර පවසන පරිදි ඉදිරි ජනාධිපතිවරණය තමන් සහ අනෙක් කඳවුරක් අතර වන ද්වන්ධ සටනකි. ඒ අනුව අනුර වෙනත් කිසිදු පක්ෂයක් හා සන්ධාන ගතවීමක් නොවන බව හඟවා ඇත. එහෙත් ජී.එල්. - ඩලස් කණ්ඩායම අනුරට සහයෝගය ලබා දී ජාජබය සමඟ වන සංධානයක් අපේක්ෂාවෙන් සාකච්ඡා කරන බවත් දැනගැනීමට තිබේ. ඒ එම සන්ධානයේ අගමැති අපේක්ෂකයා ලෙස ඩලස් ඉදිරිපත් වීමේ සූදානම ඇතිවය. කෙසේ නමුත් එම එකඟතාවයන් ගැන තවදුරටත් සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.

ඒ කොහොම නමුත් මෙවර ජනාධිපතිවරණය පැහැදිලිවම කඳවුරු දෙකක් අතර වන තීරණාත්මක මැතිවරණයක් වීම වලක්වාලිය නොහැක. නමුත් ඒ අනුර පවසන ආකාරයේ කඳවුරු දෙකක් නොවේ. මෙහිදී කඳවුරු බෙදෙනු ඇත්තේ "රට ගොඩදාන කඳවුර" සහ "රට වළදාන කඳවුර" ලෙසය. මන්ද යත් මෙවර ජනාධිපතිවරණයේ ප්‍රධාන සාධකය වන්නේ පුද්ගලයන් නොව ප්‍රතිපත්තීන් වන නිසාය.

රට ගොඩදාන සැලැස්මක් සහිතව මේ වන විට දේශපාලන කරලියේ සක්‍රියව සිටින්නේ ජනාධිපති රනිල් සමඟ වන කණ්ඩායම පමණය. අනෙක් සියළු පාර්ශ්ව පුද්ගල සාධකය පදනම් කරගෙන දේශපාලන මෙහෙයුම්වල යෙදෙනවා විනා ස්ථිර සාර, ප්‍රයෝගික වැඩ පිළිවෙලක් ඉදිරිපත් කිරීමට අපොහොසත්ව සිටී.

පවතින ආර්ථික අර්බුදය විසඳා ගැනීමට රනිල් වික්‍රමසිංහ ඉදිරිපත් කර තිබෙන වැඩපිළිවෙලට, විකල්ප වැඩ පිළිවෙලක් මෙතෙක් කිසිදු පාර්ශ්වයකින් ඉදිරිපත්ව නැති බව පැහැදිලිව පෙනෙන තත්වයන් හමුවේ සහ මේ වන විටත් ජනාධිපතිවරයා සිය වැඩපිළිවෙල සාර්ථකත්වය කරා ගෙනයමින් ජනතාව අත්විඳි බරපතල පීඩාකාරිත්වයෙන් මුදවා, රට සංවර්ධනයේ දිශාවට යොමු කරන දැවැන්ත වැඩපිළිවෙලක් සමඟ කටයුතු කරමින් සිටින බව පෙන්වා තිබීම මත ජනාධිපතිවරණයේ එක් කඳවුරක් බවට එය නිතැතින්ම පත් වේ. ඊට එරෙහිව ඉදිරිපත් වන කවරකුගේ වුවද රනිල්ගේ වැඩපිළිවෙල අභිබවා යන සාර්ථක වැඩපිළිවෙලක් ඉදිරිපත් කිරීම විය යුතුය. නමුත් විපක්ෂ කණ්ඩායම්වල යෝජනා රට යළි වළටම තල්ලු කරන විසුළුකාරී සහ මුග්ධත්වයෙන් යුතුවූවා මිස සාකච්ඡාවකට ගත හැකි මට්ටමේවත් නොවීය. කෙසේ නමුත් මේ වන විට තිබෙන දේශපාලන පෙළගැස්ම අනුව ඉදිරි ජනාධිපතිවරණය ජනාධිපති රනිල් සහ ජනප්‍රිය චරිතයක් ලෙස අනුර අතර ද්වන්ධ සටනක් වීමෙහි ඉඩ කඩ වැඩිය. තවත් ලෙසකින් කිවහොත් ප්‍රතිඵල පෙන්වූ අපේක්ෂකයා සහ ප්‍රතිඵල පොරොන්දුවන අපේක්ෂකයා අතර සටනක් වෙනු ඇත.

ඒ අනුව ඉදිරි ජනාධිපතිවරණයේදී තීරණාත්මක කාරණය බවට නිතැතින්ම පත්වන්නේ ජනපති රනිල් ඉදිරිපත් කළ ප්‍රතිපත්ති සහ වැඩපිළිවෙලය. සමාජ වෙනසක් අපේක්ෂා කළ පුරවැසි ජනතාව ඒ අපේක්ෂාව යථාර්ථයක් කළ හැකි බව පෙන්වා සිටින පාර්ශ්වයට තවදුරටත් ඉඩ දෙනවා මිසක කටකයිවාරු කියවන හුදු ජනප්‍රිය පුද්ගල සාධක පස්සෙ වැටීමේ ඉඩ මෙවර සීමාසහිතය. මෑත කාලීනව පුද්ගල සාධක විශ්වාස කරමින් ගනු ලැබූ තීරණයන්හි ඵල විපාක තේරුම් ගෙන ඇති බහුතර ජනතාව, ඒ ලැබූ අත්දැකීම් අනුව මෙවර වඩාත්ම නිවැරදි ප්‍රායෝගික ප්‍රතිපත්තිමය දේශපාලන මාවතක් තෝරගැනීම පහසුවෙන් සිදු කරනු ඇති බවත් පැහැදිලිය.



# උසස් අධ්‍යාපනයේ මීළඟ පිම්ම

මීට දශක කිහිපයකට පෙර ගත යුතුව තිබූ ප්‍රතිපත්තිමය තීරණ නොගැනීම නිසා අද වන විට ශ්‍රී ලංකාව ආර්ථික වශයෙන් බංකොලොත්භාවයට පත්ව ඇති අතර දේශපාලනික වශයෙන් ද අර්බුද රාශියකට මැදිව ඇත. මෙම තත්වයට ඇඟිල්ල දික්වන්නේ නිදහසින් පසුව දශක හතක් රට පාලනය කළ දේශපාලන අධිකාරියට හා රාජ්‍ය නිලධාරීන්ටය. නමුත් පැවති රජයන් විසින් රටට යහපත් දෙයක් කිරීමට ගත් බොහෝ උත්සාහයන් ආපස්සට හරවමින් තමන්ගේ පටු දේශපාලන මතය පමණක් ජයග්‍රහණය කරවීමට වෙරදරණ ඊනියා දේශපාලන ව්‍යාපාරවල ක්‍රියාකාරකම් වැඩි වශයෙන් හේතු වූ බව අප තේරුම් ගත යුතුය.

කෙසේ වෙතත් ගෝලීය ආර්ථික, දේශපාලන හා සමාජ ප්‍රවණතාවයන්ට සාර්ථකව මුහුණ දෙමින් සංවර්ධන අරමුණු ජය ගැනීමට දැනට පවතින අණ පනත් වෙනස් කිරීමට හා අනාගතයට ගැලපෙන අණ පනත් සම්මත කරවා ගැනීමට කටයුතු කිරීම වැදගත්ය. මේ නිසාම ගෝලීය තත්වයන්ට මුහුණදීමට වැදගත් අණ පනත් 55ක් පමණ වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ බලයට පත්වීමත් සමඟ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කරගෙන ඇත. ඉන් සමහරක් ඉංග්‍රීසි පාලන සමයේ සිට පැවත එන හා කාලීනව සංශෝධනය වී නැති ඒවාය. තවත් සමහරක් නව අණ පනත්ය. එසේම තවත් එවැනි අණ පනත් 50ක් පමණ ඉදිරියේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරන අතර ඒවා වත්මන් ගෝලීය තත්වයන් සමඟ රට බැඳ තැබීමට හේතු වනු ඇත.

එසේම, ශ්‍රී ලංකීය දරු පරපුරට අනාගත ලෝකය ජයගැනීමට අවශ්‍ය දැනුමින් සන්නද්ධ වීමට අවශ්‍ය පරිසරය රට තුළ ගොඩනැගීම හා සම්බන්ධ අණපනත් පිළිබඳව ආණ්ඩුව ප්‍රතිපත්තිමය තීරණ සකස් කරමින් සිටියි. ඒ අනුව ඉදිරිපත් විය යුතු වැදගත් පනතක් වන්නේ, **"ජාතික උසස් අධ්‍යාපන කොමිෂන් සභාව"** ස්ථාපිත කිරීම පිළිබඳ යෝජනාවය. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට මේ වන විටත් පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කර අවශ්‍ය කටයුතු කරමින් සිටින අතර එහි අතුරු වාර්තාවක්ද ප්‍රසිද්ධියට පත් කර ඇත.

ශ්‍රී ලාංකීය දූ දරුවන්ට ගෝලීය තරඟකාරීත්වයට මුහුණදීමට අවකාශ විවෘත කිරීම සඳහා උසස් අධ්‍යාපනයේ ප්‍රතිසංස්කරණ ඇති කිරීම සඳහා මෙවැනි කොමිෂන් සභාවක් පිහිටුවීමේ වැදගත්කම පිළිබඳ අප සාකච්ඡා කළ යුතුය.

වාර්ෂිකව අ.පො.ස. උසස් පෙළ සමත්ව උසස් අධ්‍යාපනයට සුදුසුකම් ලබන ශිෂ්‍ය ප්‍රජාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පාලනය වන රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතියට Z-Score පදනමින් ඇතුළත් කර ගන්නේ ආසන්න වශයෙන් 35,000ක පමණ ශිෂ්‍ය සංඛ්‍යාවකි. මෙයට අමතරව විවිධ අමාත්‍යංශ යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය අංශයේ විශ්වවිද්‍යාල ආයතන 05 සඳහා Z-Score පදනමින් තොරව සිසුන් 3,000ක් පමණ වාර්ෂිකව බඳවා ගනු ලබයි. ඒවා නම් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාක්මක, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, භික්ෂු විශ්වවිද්‍යාලය, ධීවර අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන සාගර විශ්වවිද්‍යාලය, ආරක්ෂක අමත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වෘත්තිය පුහුණු අමත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන වෘත්තීය පුහුණු විශ්වවිද්‍යාලය හා වෙළෙඳ අමාත්‍යංශය යටතේ ඇති ජාතික ව්‍යාපාර හා කළමනාකරණ ආයතනය (NIBM) යන ආයතන වේ. තවද මෙයට අමතරව රාජ්‍ය අංශය මඟින් පාලනය වන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය හා කාර්මික විද්‍යාල පද්ධතියක්ද ක්‍රියාත්මකව පවතී.

වාර්ෂිකව උසස් පෙළ සමත්වන 180,000ක් පමණ වන දරුවන්ට මෙම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ හා වෙනත් අමාත්‍යංශ යටතේ ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාල සංඛ්‍යාව කිසිසේත්ම ප්‍රමාණවත් නොවන අතර මෙම ආයතනවලින් පවත්වන ඇතැම් පාඨමාලාවන් ඵලදායි නොවීමට ඉඩ ඇත.

උසස් පෙළින් පසුව උසස් අධ්‍යාපනයට සුදුසුකම් ලබා ඩිප්ලෝමාවක සිට උපාධියක් ලැබීම දක්වා කවර තැනකදී හෝ තම ජීවන ගමනට අධ්‍යාපනයෙන් හා කුසලතාවයෙන් වටිනාකමක් එක්කර ගැනීමට අවස්ථාවක් තිබිය යුතුය. නමුත් එම අවස්ථා අපේක්ෂා කරන දරුවන්ට සියළු දෙනාටම තමන්ගේ හිතැඟියාව පරිදි අවශ්‍ය අධ්‍යාපනය ලැබීමට අවකාශ විවෘත කිරීමට හැකි තත්වයක් ශ්‍රී ලංකාවේ පවතින උසස් අධ්‍යාපන ක්‍රමය තුළ අහිමිවීම කණගාටුවකි.

මෙම විභවය සපුරාලීමට මෙරට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට දේශීය හා විදේශීය උසස් අධ්‍යාපන ආයතන සැලකිය යුතු සංඛ්‍යාවක් දැනටමත් ඇතුලත් වී ඇත. මෙම ආයතන ලංකාවේ පවතින නීති පද්ධතිය තුළ හඳුන්වන්නේ, උසස් අධ්‍යාපන ආයතන ලෙසය. එම ආයතන උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශයෙන් ලබා ගත් උපාධි ප්‍රදානය කිරීමේ බලතල සහිත උසස් අධ්‍යාපන ආයතන වශයෙන් හෝ විදේශ විශ්වවිද්‍යාලයන්ගේ පාඨමාලා මෙහෙයවන මණ්ඩප (Campus) වශයෙන් කටයුතු කරයි. කණගාටුවට කරුණ වන්නේ මෙම පෞද්ගලික අංශයේ උපාධි ප්‍රදානය කිරීමේ බලයලත් ආයතන හා විදේශ විශ්වවිද්‍යාලයන්ට අනුබද්ධ මණ්ඩප කිසිවක් ශ්‍රී ලංකාවේ විධිමත් නියාමනයකට ලක් නොවේ.

මේ වන විට රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතුවල නිරත ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් පෞද්ගලික අංශයේ උපාධි ප්‍රදානය කිරීමේ බලයලත් ආයතන හා විදේශ විශ්වවිද්‍යාලයන්ට අනුබද්ධ මණ්ඩපවල උසස් අධ්‍යාපන කටයුතුවල නිරත වේ. මෙම ආයතන විධිමත් නියාමනයකට ලක් නොවන බැවින් ඒවායින් බොහෝ අකටයුතුකම් සිදු කරමින් වැරදි තොරතුරු ලබා දෙමින් පාඨමාලා මෙහෙයවයි. උදාහරණයක් ලෙස ඔවුන් සිය ආයතන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් (UGC Approved) බවට මතයක් සමාජගත කරයි. නමුත් සත්‍ය එයට වඩා වෙනස්ය. එනම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව පිළිගෙන ඇත්තේ අදාල විදේශ විශ්වවිද්‍යාලය මිස පාඨමාලා හෝ එම පාඨමාලා මෙහෙයවන මෙරට මණ්ඩප නොවන බව පාඨමාලාවලට ඇතුලත්වන සිසුන් නොදන්නා දෙයකි.

මෙයට අමතරව තවත් වැදගත් කරුණු කීපයකි. එනම්, අද වන විට මෙරට උසස් අධ්‍යාපනය හදාරන පෞද්ගලික

> **ඔවුන් සිය ආයතන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් (UGC Approved) බවට මතයක් සමාජගත කරයි. නමුත් සත්‍ය එයට වඩා වෙනස්ය. එනම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව පිළිගෙන ඇත්තේ අදාල විදේශ විශ්වවිද්‍යාලය මිස පාඨමාලා හෝ එම පාඨමාලා මෙහෙයවන මෙරට මණ්ඩප නොවන බව පාඨමාලාවලට ඇතුලත්වන සිසුන් නොදන්නා දෙයකි.**

උසස් අධ්‍යාපන ආයතනවල සිටින ශිෂ්‍ය ප්‍රමාණය කොපමණද යන්න හා අදාල පාඨමාලා මොනවාද යනාදි වශයෙන් දත්තයන් ගත හැකි මූලාශ්‍රයක් නොමැතිවීම නිසාම පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය විධිමත් පාලනයකට හා නියාමනයට ලක්ව නැති බවය.

මෙම කරුණු සලකා බලා ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය විධිමත් ආකාරයේ නියාමනයකට ලක්කර ජාත්‍යන්තර මට්ටමින් පිළිගැනීමක් ලබා ගතහැකි ආකාරයේ ආයතනයක් පිහිටුවීම දීර්ඝ කාලයක් සාකච්ඡා වූ යෝජනාවකි. එමෙන්ම ජාතික උසස් අධ්‍යාපන කොමිෂන් සභාවක් පිහිටුවීමට සමගාමීව උසස් අධ්‍යාපනයේ "ගුණාත්මකභාවය තහවුරු කිරීම හා ප්‍රතීතනය සඳහා වූ සභාව"ක් (Quality Assurance and Accreditation Council) පිහිටුවීම පිළිබඳවද එම වාර්තාවෙන් කරුණු ඉදිරිපත් කර ඇත. එමෙන්ම ගුණාත්මකභාවය තහවුරු කිරීම හා ප්‍රතීතනය සඳහා වූ සභාවක් පිහිටුවීම සඳහා 2023 අයවැය මඟින් යෝජනා කර ඇති අතර ඒ සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කර ඇත.

මේ පිළිබඳව ජනතාවත් විශේෂයෙන් විශ්වවිද්‍යාල ප්‍රජාවත් අතර පවතින වැරදි හා තර්කානුකූල නොවන මතවාදයන් පිළිබඳව දැනුවත් වීමද වැදගත්ය. මෙම ජාතික උසස් අධ්‍යාපන කොමිෂන් සභාවක් පිහිටුවීමෙන් කිසිවිටක, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වසා දැමීමක් නොවන අතර සිදුවන්නේ එම ආයතනය ශක්තිමත් කිරීමකි. දැනට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය ද කලින් පැවැතියේ විශ්වවිද්‍යාල කොමිෂන් සභාව යටතේය. එමෙන්ම පසුගිය කාලයේ ආන්දෝලනයට ලක් වූ දැනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඍජු නියාමනයට ලක් නොවන, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය නියාමනය පවා මේ අනුව නව කොමිසන් සභාවට පැවරෙනු ඇත.

එහිදී පාඨමාලාවන්හි ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම පමණක් නොව සෑම රාජ්‍ය මෙන්ම පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනයකම පවතින පාඨමාලවන් සමාන තත්වයන්ට ගෙන ඒම සඳහා උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම හා ප්‍රතීතනය සඳහා වූ ස්වාධීන සභාව වැදගත්වනු ඇත. පසුගිය කාලයේ සයිටම් වෛද්‍ය පීඨ ගැටළුව සාකච්ඡා කරන විටද විශ්වවිද්‍යාල ප්‍රජාව තුළින් මතු වූ කරුණක් වූයේ, උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම හා ප්‍රතීතනය සඳහා වූ ස්වාධීන සභාවක් පිහිටුවන ලෙසය.

මෙවැනි ජාතික මට්ටමේ කොමිෂන් සභාවක් පැවතියහොත් රාජ්‍ය හෝ පෞද්ගලික වශයෙන් බේදයක් නොමැතිව ඕනෑම පාඨමාලාව සඳහා අවශ්‍ය අවම ලකුණු එකම අගයක් ගනු ඇත. එමෙන්ම කිසියම් විෂයයක් උගන්වන රාජ්‍ය වේවා පෞද්ගලික වේවා සෑම පීඨයක්ම සමාන තත්වයට පැමිණෙනු ඇත. උසස් අධ්‍යාපන අංශය විධිමත් ආකාරයේ නියාමනයකට ලක්වීමේදී දැනට පවතින රාජ්‍ය විශ්වවිද්‍යාල හා පෞද්ගලික අංශය උපාධි ප්‍රදානය කරන උසස් අධ්‍යාපන ආයතනවල පාඨමාලාවන් මෙන්ම විෂය නිර්දේශයන් සමාන තත්ත්වයට පත්වනු ඇත. මේ නිසා සිදුවන යහපත් දෙයක් වන්නේ ඉංජිනේරු, තොරතුරු තාක්ෂණික හා කළමණාකරණ වැනි අංශයන්ගේ රැකියා වෙළෙඳපොල ඉල්ලුම සපුරා ගැනීමට පෞද්ගලික අංශයේ උපාධිධාරීන්ට ඇති ඉහළ ඉල්ලුම රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපාධිධාරීන්ටද සමානව හිමිවීමය.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ සභාපති වීමට පෙර අවස්ථාවක, මහාචාර්ය කාලෝ ෆොන්සේකා ප්‍රකාශ කළේ, රාජ්‍ය විශ්වවිදයාලයන්ට සිසුන් ප්‍රවේශ වීමේදී පවතින කෝටා ක්‍රමය නිසා වෛද්‍ය පීඨ ප්‍රවේශයට සුදුසුකම් ලබන දරුවන් 2,500කට පමණ වාර්ෂිකව වෛද්‍ය පීඨ වරම් නොලැබෙන බවය. ඔවුන් ඒ වෙනුවට වෙනත් පාඨමාලා හැදෑරීමට යොමුවීමෙන් රටට පමණක් නොව ලෝකය වෙනුවන් බිහි කළ යුතු වෛද්‍යවරුන් පිරිස අප බිහි කිරීම අත හැරදමා ඇත. නමුත් වෛද්‍ය පීඨ ප්‍රවේශය සුදුසුකම් තිබෙන දරුවන් වෙනත් පාඨමාලා හදාරන විට ඔවුන්ට වඩා අඩු සුදුසුකම් සහිත දරුවන් විදේශයක විශ්වවිද්‍යාලයකින් වෛද්‍ය උපාධිය ලබා එන්නේ, එම සිසුන්ට රාජ්‍ය හෝ පෞද්ගලික භේදයකින් තොරව වෛද්‍ය විද්‍යාව හැදෑරීමට අවස්ථාවක් නොමැති නිසාය. ශ්‍රී ලංකාවේ විධිමත් ආයතනයකින් මෙවැනි නියාමනයක් සිදු වන්නේ නම් සිසුන්ට ඔවුන් ඇතුලත් වන්නේ රාජ්‍ය විශ්වවිද්‍යාලයකට ද පෞද්ගලික අංශයේ විශ්වවිද්‍යාලයකට ද යන්න ගැටළුවක් නොවන්නේය.

ජාතික උසස් අධ්‍යාපන කොමිෂන් සභාවක් හා ඊට සමගාමීව ගුණාත්මක භාවය තහවුරු කිරීම හා ප්‍රතීතනය සඳහා වූ ස්වාධීන සභාවක් පිහිටු වීමේ කාරණය ජය ගැනීම තුළ සිදුවන යහපත් දෙය වන්නේ ගෝලීය ආර්ථිකයට මුහුණ දිය හැකි මානව ප්‍රාග්ධනයෙන් පමණක් නොව සමාජ ප්‍රාග්ධනයෙන් ද පිරිපුන් නූතන දැනුමින් සන්නද්ධ ශ්‍රම බලකායක් රටට උරුම වීමය.

සරත් හේවගේ

# පාලකයාගේ අවිය ජනතාවගේ සවිය වන කාලයයි



රජුන් දූෂණයෙන් හොරකමින් පිරී ඇද්ද? එවැනි රටක රටවැසියා දුකින්ද පීඩනයෙන්ද පෙළෙන්නේය, පැරැන්නන් එසේ කීවද අද දක්වාම එය වලංගු කථාවකි. එවැනි අධමත්වය පිරි දූෂණය රාජාණ්ඩු කාලයේත් මෑත කාලයේත් ඕනෑ තරම් දැකිය හැකිව තිබිණි. කෙසේ වුවද විය යුත්තේ ඉතිහාසයක් හරා අවුස්සා යළි යළි දුගඳ ගැසීමට ලක් කිරීම හෝ එවැනි දූෂිත තත්වයක් රට තුළ ඇති කොට ජනතාව පීඩාවටපත් කිරීම නොව පාලකයා දූෂණයෙන් මිදී රටද දූෂණයෙන් මුදවාලීම සඳහා ඊට අදාළ පිළියම් යෙදීමය.

පසුගිය කාලයට අදාළව ගොඩනැගී තිබූ දූෂිත තත්වයන් මත රජය පමණක් නොව ජනතාවද මහත් සේ පීඩාවට පත් විය. එම නිසා එතෙක් පවත්වාගෙන ආ ක්‍රමය වෙනස් කිරීම වෙනුවෙන් දැඩි බලපෑමක් රජයට එල්ල කිරීමට රටේ අභිවෘද්ධිය පැතූ ජනතාව විසින් කටයුතු කළේය. එසේ නොමැතිව රටට යළි නැගිටීමක් නැති බවත් පැහැදිලි විය. කෙසේ නමුත් ජනාධිපති රනිල් වික්‍රමසිංහ බලයට පත්වීමත් සමග මෙකී අතීත අත්දැකීම් හා රට පත්ව ඇති තත්වයෙන් මුදවාලීම සඳහා අවශ්‍ය වන ක්‍රියා මාර්ග රැසක් ගැනීමට කටයුතු කරනු ලැබීය. ජනාධිපතිවරයෙක් පත් වූ වහාම ඔවුන්ගේ කාර්යය භාරය වන්නේ භාණ්ඩගාරයේ පවතින සංචිතයන්ට අදාළ නව වැඩපිළිවෙලක් යෝජනා කොට ඊට අදාළ මුදල් වෙන් කිරීමය. තමා වටා සිටි පිරිස් සන්තර්පණය කිරීම සඳහා කටයුතු යෙදීමය. එහෙත් අරමුණක් දැක්මක් සහිත පාලකයෙකු ලෙස ජනාධිපති රනිල් වික්‍රමසිංහ අනාගතය දෙස බැලීය.

මේ වන විට රට පත්ව ඇති තත්වය ඉතිහාසයේ අන් කවරදාටත් වඩා වේදනාකාරී වන්නේ පැවැති ධනය කාබාසිනියා කොට රටේ සමස්ත ආර්ථිකය හොම්බෙන් යන තත්වයකට පත් කොට තිබීම නිසාය. මෙය නිකම්ම සිදුවූවක් නොව එවක සිටි පාලකයන්ගේ අත්තනෝමතික ක්‍රියාකලාපය හා දූෂණය, හොරකම නාස්තිය විසින් සෑම ආයතනයක්ම එහි නිලධාරීන්ද ක්‍රියා හේතු විය. විශේෂයෙන්ම රාජ්‍ය අංශයේ දූෂිත බවට පිළියමක් ලෙස එතෙක් පැවැති මූල්‍ය ක්ෂේත්‍රයට අදාල නීති රෙගුලාසි සංශෝධනය කිරීමට පියවර ගත් අතර නව දූෂණ විරෝධී පනතක් ද සම්මත කර ගත්තේය.

රාජ්‍ය ආයතනයක හෝ එහි නිලධාරීන් විසින් පමණක් නොව මැති ඇමතිවරු විසින් ද තමන්ට රිසි සේ අල්ලස් ගැනීම්, කප්පම් ගැනීම් සිදු කරමින් දූෂිත ගනුදෙනු සිදුකිරීමට බලයක් ගොඩනගා ගත්තේ පවතින නීතිය අස්සෙන් වෙට්ටු දැමිය හැකි තත්වයක් යටතේය. එසේ වීමට හේතු වූයේ එතෙක් පැවැති 1954 දී සම්මත කරගෙන තිබූ අල්ලස් පනතේ පැවැති හිල් තිබූ නිසාය. එසේම එවැනි චෝදනාවන් විනිශ්චය කිරීමට තිබූ කොමිසම් සභාවේ අඩුපාඩුකම් තිබීම හේතුවෙන් පසුව 1994 දී සම්මත කොට ගත් අල්ලස් චෝදනා විමර්ශන කොමිසන් සභා පනත ද යළි සංශෝධනය කළ යුතුව පැවැතුනි. එසේම මැති ඇමතිවරු හා රාජ්‍ය නිලධාරීන් රජයේ තනතුරුවලට පත්වීමෙන් පසුව උපයන ප්‍රමාණයන් සම්බන්ධයෙන් නිසි වගවීමක් විගණනයක් නොමැති විය. එබැවින් අලුතින් ගොඩනඟා ගන්නා වත්කම් කෙසේ ඒ ඒ බලධාරීන් සහ නිලධාරීන් විසින් කෙසේ ගොඩනගා ගන්නේද යන්න විනිශ්චය කිරීමට තිබූ 1975 දී සම්මත කොට ගත් වත්කම් බැරකම් ප්‍රකාශ නීති පනත ද අදාල අරමුණ වෙනුවෙන් සක්‍රීයව ක්‍රියාත්මක නොවුණි.

කෙසේ නමුත් මේ සම්බන්ධයෙන් සොයා බලා මේ සියලු අඩුපාඩුකම් සමනය කොට නව දූෂණ විරෝධී පනත සම්මත කොට ගෙන පැවැති පනත්හි අඩුපාඩුකම් සපුරා එක් පනත් ලෙස ගෙන ඒමට කටයුතු කළේය. මේ තුළින් යම් දූෂණයක්, වංචාවක්, අල්ලසක් හෝ කප්පම් ගැනීමක් හෝ මොනයම් ආකාරයකින් සිදු වුවද ඒවා නීතියේ රැහැනට හසුකරගෙන දඬුවම් පැමිණවීමට අදාළ නීති ශක්තිමත් කිරීම අදාළ දූෂණ විරෝධී පනත බලාත්මක කළේය.

මේ අනුව රාජ්‍ය ආයතනයක හෝ පුද්ගලික ආයතනක හෝ වෙනත් ක්‍රීඩා වැනි අංශයක හෝ දූෂණයක් අල්ලස් ගැනීමක් සිදුවන්නේ නම් ඒ සම්බන්ධයෙන් වහා ක්‍රියාත්මක වන වැඩපිළිවෙලක් අඩංගු කළේය. නව පනතේ ලිංගික අල්ලස් ගැනීම සම්බන්ධයෙන් වෙනම සඳහන් වන අතර ඊට අදාළ දඬුවම්ද වැඩි කරනු ලැබීය. ක්‍රීඩා වැනි ක්ෂේත්‍රයන්හි නව පනත් කෙටුම්පතින් එහි සිදුවිය හැකි වංචාවන් හා දූෂණයන් නැති කිරීමට අදාළ නීති රැගෙන විත් ඇත. ජනපතිවරයාගේ රට මෙහෙයවීමේ ඉලක්කය 2048 දී සංවර්ධිත රටක් ලෙස මේ රට තැබීමට නම් ගෙවෙන එක් දවසක් හෝ කිසිදු ආයතනක හෝ සංවර්ධනයට දායක වන ස්ථානයන්හි දූෂණය තිබිය නොහැකිය. ඒ කුමක් නිසාද යන්න කිරා මැන බැලෙන්නේ මේ දූෂණයන් හේතුවෙන් ආපස්සට යැවෙන තප්පර පැය හෝ දින ගණන් යනු සංවර්ධනය විනාශ කිරීමේ කාලයන් වන නිසාය. මේ නිසා සමාජය ප්‍රජාතන්ත්‍රවාදී වීම සඳහා දූෂණ විරෝධී පනත අනිවාර්යය අඩංගුවක් වීම ඔහුගේ දැක්මේ එක් පැතිකඩකි..

වාද විවාද මධ්‍යයේ මෙය සම්මත වීමත් සමඟ ආයතනික මට්ටමින් හෝ පැවැති අනෙක් පැරණි නීතිරීති, දූෂිත සම්ප්‍රදායන් ගණනාවක්ම මේ අනුව වෙනස් කොට දූෂණයට වැට බැඳීමට කටයුතු යෙදී ඇත.

මෙතෙක් මූල්‍යමය තත්වයක් පමණක් මෙහිලා ගණන් බලා තිබුණු අකටයුතුකම්වලට එහා ගොස් නව දූෂණ විරෝධී පනත මගින් ලිංගික අල්ලස් ගැනීම, පෞද්ගලික ආයතන තුළ සිදුවන අල්ලස්, නව නීති යටතේ විශේෂයෙන්ම සඳහන් කර ඇත. අල්ලස යනුවෙන් මූල්‍යමය හෝ තුටු පඬුරු පමණක් නොව රැකියාවක් හෝ කොන්ත්‍රාත්තුවක් හෝ වේ නම් ඒ සියල්ල අලලා මෙය සකස් කොට ඇත.

එසේම මෙතෙක් ආයතන මට්ටමින් රාජ්‍ය අංශය වෙත පමණක් තිබූ මෙම පනතේ බලය පෞද්ගලික අංශයටද අදාළව එම කාර්යාල තුළ සිදුවන පෙරකී අල්ලස් ගැනීම් වරදක් ලෙස දක්වා නීතිය පැනවීම නව දූෂණ විරෝධී පනතේ සුවිශේෂීත්වය වේ. එමෙන්ම රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීම, විනිවිදභාවය පවත්වාගෙන යෑම වෙනුවෙන් පැවැති අණපනත් රැසක් සංශෝධනය කිරීම, නව රෙගුලාසි, චක්‍රලේඛ පැනවීම් රැසක්ද මෙම කාලය තුළ සිදු විය.

මේ අතර දූෂණය වැලැක්වීම වෙනුවෙන් බලගැන්වෙන තවත් පනතක් වන්නේ මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතය. මෙතෙක් අන්ත දූෂිත අන්දමින් උපයන ධනය, ජාවාරම්කරුවන්ගේ අයථා ධනය, එකතු කොට මැතිවරණ ව්‍යාපාරය දියත් කිරීම සාමාන්‍ය පොදු ක්‍රමයක් ලෙස පැවැතියේය. මේ නිසා ඇති හැකි එකා පෝස්ටර් ගසා පිම්බී ජනතාව මුලා කොට හෝ ඡන්දයට මුදල් වියදම් කොට ජනතාව රවටා ඡන්දය බිලි බා ගැනීම සිදු විය. ඡන්ද අල්ලස් දුන්නේය. රටක් ඉදිරියට යාමට නම් එහි පුරවැසියාට අනිසි බලපෑමකින් තොරව වඩාත් ප්‍රජාතන්ත්‍රවාදීව සමාන සාධාරණ තත්වයන් යටතේ තම නියෝජිතයා තෝරාගැනීමට හැකිවිය යුතු බව ජනාධිපති රනිල්ගේ දැක්ම විය. එය ප්‍රජාතන්ත්‍රවාදී රටක මූලික මිනිස් අයිතියේ කොටසක් ලෙස දක්වන ඔහු රටක් සංවර්ධනය කිරීම සඳහා වන ගමනේදී එහි පුරවැසියාගේ අයිතියට බලපෑම් කිසිදු ලෙස සිදු නොවීම අනිවාර්යයකි. පළාත් පාලන මැතිවරණය කඩිනමින් පවත්වා ගැනීමට විපක්ෂය විසින් දැමූ දහසක් කොන්දේසි හා විලාපයන් තඹ සතේකට මායිම් නොකළේ ජනාධිපතිවරයාට තමන් විසින් දියත් කරන දූෂිත ක්‍රමය වෙනස් කිරීමේ හෙවත් සිස්ටම් චේන්ජ් සිදුකිරීම මැතිවරණයට වඩා ප්‍රමුඛත්වයේලා සැලකීම හේතුවෙනි. එසේ නොවුවා නම් තවත් දූෂිතයින් පිරිසක් පළාත් සභා සඳහා පත් කොට නැවත පෙර පරිදි ජනතා මුදල් මංකොල්ල කෑමට ඉඩ සලසාදීමක් වීමට හැකිය. අනෙක් කාරණය දේශපාලකයා වෙනුවෙන් ධනය වැය කරන පිරිස් යළි පෙරළා එමෙන් කිහිප ගුණයක වාසියක් දේශපාලකයාගෙන් බලාපොරොත්තු වීම සිදුවෙයි. ඒ අනුව දේශපාලකයාට දූෂිත ලෙස කටයුතු කිරීමට සිදුවීම අනිවාර්ය තත්වයක් විය. රාජ්‍ය අංශය දූෂිත වීමට මෙම මැතිවරණ ක්‍රමය බලපා තිබුණේ එසේය. ඒ අනුව පිරිසිදු ලෙස මහජන නියෝජිතයෙකු තෝරා ගැනීමේ හැකියාව සහතික කරන නීති සම්මත කිරීම රටට යහපතක්ම වන්නේය.

දේශපාලන ලෝකයේ බලය රඳා පවතින්නේ මඩ අවලාද හා මාධ්‍ය සෙල්ලම් මැදය. මෙය සිදු කිරීමට මාධ්‍යයට උල්පන්දම් දෙනුයේ පත්වන දේශපාලකයින්ය. ඔවුන් විසින් මාධ්‍යයට දී ඇති ලයිසන් එක භාවිතා කොට කිසිදු ලැජ්ජාවක් නැතිව ජනතාවගේ සංඛ්‍යා දත්ත එක් එක් දේශපාලනඥයාගේ හෝ දේශපාලන පක්ෂක අතකොළුවක් බවට පත්වී ජනතා අයිතිය නැති කිරීමට කටයුතු කිරීම අපරාධයකි. මේ තත්වයන් සැලකිල්ලට ගෙන ජනතාවගේ අයිතිය ජනතාව සඳහා භාවිතා කිරීම මාධ්‍යයේ වගකීමක් වන අතර ඕනෑ ඕනෑ ලෙස පුද්ගලයින්ට චෝදනා කිරීමට හා ජීවිත තර්ජනය කිරීමට මාධ්‍යයට ඇති බලය සීමා කළ යුතුව ඇත. ඒ සඳහා විසඳුම් ලෙස විකාශන සේවා සඳහා නිකුත් කර ඇති බලපත්‍ර අවභාවිතා කිරීම වැළැක්වීම සඳහා විකාශන වැඩසටහන් තුළින් මාධ්‍ය සාක්ෂරතාව, දැනුම හා අධ්‍යාපනයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම, සමාජයේ බහුත්වවාදයට ගරු කරමින් විකාශන සේවා සැපයීම තහවුරු කිරීම, ජනතාවගේ මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා විකාශන මාර්ගෝපදේශ නිකුත් කිරීම, සාහිත්‍ය ප්‍රවර්ධනය වන පරිදි ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින්, කාන්තාවන් හා බාලවයස්කරුවන්ගේ අයිතීන් තහවුරු කිරීම, මහජන සාමයට, ජාතික ආරක්ෂාවට සහ ජාතික ආර්ථිකයට හානිදායක නොවන පරිදි විකාශන සේවා පවත්වාගෙන යාම තහවුරු කිරීම ආදී නීති රාශියකින් සමන්විතව විද්‍යුත් විකාශන නියාමන කිරීම වෙනුවෙන් පියවර ගෙන තිබේ. මෙයත් එක්තරා ආකාරය සමාජ සංස්කෘතික දූෂණය වැලැක්වීමේ පියවරකි. මෙය සමස්ත රට වැසියාගේ මාධ්‍ය නිදහස තහවුරු කිරීමක් වන අතර මාධ්‍යයට වල් බූරූ නිදහසක් ක්‍රියාත්මක කිරීම වලකාලීමකි.

රටේ විවධ ක්ෂේත්‍රවල පවතින අකටයුතුකම් දූෂිත තත්වයන් වැලැක්වීම වෙනුවෙන් යැයි කියමින් එහෙන් මෙහෙන් පැලැස්තර විසඳුම් යෝජනා කරනවා වෙනුවට සමස්තයම ආවරණය වන පරිදි සිස්ටම් එකම එකවර සුද්ද පවිත්‍ර කරන වැඩපිළිවෙලක් දැන් ක්‍රියාත්මකව තිබේ.

මේ ආදි වශයෙන් තවත් ක්ෂේත්‍ර ගණනාවකම ගැටළු විසඳා නව ශ්‍රී ලංකාවක් ගෙඩනැගීම වෙනුවෙන් මේ වන විටත් අණ පනත් 55ක් 2022 වර්ෂය හා 2023 වර්ෂයේ ගත වූ මාස කිහිපය තුළ සම්මත කොට බලාත්මක කර ඇති අතර තවත් එවැනි නව පනත් හා සංශෝධන 50කට වැඩි ප්‍රමාණයක් කෙටුම්පත් කොට ඇත. මේ සියල්ල රටක් සාදාචාරවත් සමාජයක් හා විශිෂ්ට දේශපාලන සංස්කෘතියක් අරඹයාය. ජනාධිපතිවරයා විසින් ක්‍රියාවට නංවා ඇති 2048 සංවර්ධිත රටක් දක්වා වන ගමන සඳහා මග විවර කරනුයේ මේ නීති අණ පනත් මගින් ශික්ෂණය වූ සමාජය විසිනි. එය සංවර්ධනයේ අනාගත ක්‍රියාදාමය කවර පාලකයකු වෙතින් සිදුවන්නේ වුව සැබැවින්ම එය යථාර්තවත් වීමට මහත් පිටුබලයක් වීම අනිවාර්යය. එවැනි රටක් නැවත බංකොලොත් වීම හෝ සමාජ දේශපාලනික පාදඩකරණයට ලක්වීම සිදු නොවීම යන්න අනිවාර්යයක් වනු ඇත.

කේ.පී.අයි. ප්‍රියංගනී

# ප්‍රිගොෂින් "දුෂ්කර ජීවිතයක් ගත කළ දක්ෂ මිනිසෙකි" - පුටින්




බදාදා (23) මොස්කව් අසල ගුවන් අනතුරකින් මියගිය යෙව්ගනි ප්‍රිගොෂින් ඇතුළු 10 දෙනෙකු වෙනුවෙන් රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් සිය ශෝකය ප්‍රකාශ කළේය. ප්‍රිගොෂින් රුසියානු කුලී හේවා කණ්ඩායමක් වන Wagnerහි ප්‍රධානියා විය.

පුටින්, ප්‍රිගොෂින් හැඳින්වූයේ "**දුෂ්කර ජීවිතයක් ගත කළ දක්ෂ මිනිසෙකු**" ලෙසය. ඔහු මේ බව පැවසුවේ රුසියාව විසින් පාලනය කරනු ලබන නැගෙනහිර යුක්රේනයේ කොටසක නායකයා වන ඩෙනිස් පුෂිලින් සමඟ අදහස් දක්වමිනි.

මොස්කව්හි ගුවන් තොටුපළකින් ගුවන්ගත වී සුළු වේලාවකින් මෙම යානය කඩා වැටී ඇති අතර එය ශාන්ත පීටර්ස්බර්ග් වෙත යමින් තිබුණි. අනතුරට හේතුව කුමක්දැයි සොයා බලන බවට ජනාධිපති පුටින් පොරොන්දු විය.

බදාදා සවස එය කඩා වැටෙන විට ප්‍රිගොෂින් ඇතුළු පුද්ගලයින් දස දෙනෙකු පෞද්ගලික ජෙට් යානයේ සිට ඇත. අනතුරින් මියගිය සියලු දෙනාගේ පවුල්වලට ජනාධිපති පුටින් සිය ශෝකය පළ කළේය.

නිරෝෂන් පෙරේරා

# ඉන්දියාව දැන් සඳ මතය

සඳෙහි දක්ෂිණ ධ්‍රැවයට සාර්ථකව අභ්‍යවකාශ යානයක් ගොඩ බැස්වූ පළමු රට බවට පත්වෙමින් බදාදා ඉන්දියාව ඉතිහාසගත විය. මෙම විස්මිත ජයග්‍රහණයෙන් සමග ඉන්දියාව සඳ තරණය කළ ලොව සිව්වන රට බවට පත් විය.

මෙම චන්ද්‍රයාන්-3 අභ්‍යවකාශ යානය ජූලි 14 වන දින දකුණු ඉන්දියාවෙන් ගුවන් ගත වූ අතර සැප්තැම්බර් 7 වන දින එය සඳ මත ස්පර්ශ විය. මෙම මෙහෙයුම සාර්ථක කරගැනීමට ඉන්දීය අභ්‍යවකාශ පර්යේෂණ සංවිධානයේ (**ISRO**) විද්‍යාඥයින් සහ ඉංජිනේරුවන් බොහෝ වෙහෙස මහන්සි වී වැඩ කළහ.

ලෑන්ඩරය නිරුපද්‍රිතව පතිත වන අවස්ථාවේ ඉන්දියාව පුරා උත්සව පැවැත්විණි. ලක්ෂ සංඛ්‍යාත පුරවැසියන් මෙම විස්මිත අවස්ථාව රූපවාහිනිය මඟින් උද්යෝගයෙන් නැරඹූ අතර බොහෝ දෙනෙක් මෙහෙයුමේ සාර්ථකත්වය සඳහා යාච්ඤා කළහ. ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි, දකුණු අප්‍රිකාවේ සිටි නමුත් ඔහු මෙම ඉතිහාසගත අවස්ථාව සජීවීව නැරඹුවේය. ඔහු ඉන්දියානු ධජය අභිමානයෙන් ළෙල දෙවමින් ප්‍රකාශ කළේ "**ඉන්දියාව දැන් සඳ මතයි**" යනුවෙනි.

**ISRO**හි සභාපතිවරයා පැවසුවේ කුඩා රෝවරය දැන් ලෑන්ඩරයෙන් වෙන්ව ගොස් සති 2ක පමණ කාලයක් සඳ මතුපිට අත්හදා බැලීම් සිදු කරනු ඇති බවයි. එය දක්ෂිණ ධ්‍රැවය ආසන්නයේ ඇති පාෂාණ සහ පසෙහි සංයුතිය අධ්‍යයනය කරනු ඇත. අනාගත සඳ මෙහෙයුම් සඳහා වැදගත් සම්පතක් වන ශීත කළ ජල අයිස් මෙම ප්‍රදේශයේ තිබිය හැකි බව විද්‍යාඥයින් විශ්වාස කරයි.

2019 දී ඉන්දියාවේ පෙර උත්සාහය අසාර්ථක වූයේ ලෑන්ඩරය එහි අවසාන බැසයාමේදී කඩා වැටීමෙනි. විද්‍යාඥයන් එම වැරැද්දෙන් ඉගෙන ගත් අතර චන්ද්‍රයාන්-3 සඳහා බොහෝ වැඩිදියුණු කිරීම් සිදු කළහ. මෙම සාර්ථක ගොඩබෑම සමග ඔවුන්ගේ වෙහෙස මහන්සියේ ප්‍රතිපල සාර්ථක විය.




### සඳෙහි දක්ෂිණ ධ්‍රැවය මෙතරම් වැදගත් වන්නේ ඇයි?

සඳෙහි දක්ෂිණ ධ්‍රැව ප්‍රදේශය විද්‍යාඥයින්ට විශේෂයෙන් සිත් ඇද ගන්නා සුළු වන්නේ එහි කිසිදා හිරු එළිය නොපෙනෙන ස්ථිර සෙවන සහිත ආවාට පවතින බැවිනි. මෙම අඳුරු ආවාට වසර බිලියන ගණනක් පුරා ගොඩනැගුණු ශීත කළ ජල තැන්පතු රැඳවිය හැකි බව විශ්වාස කෙරේ. සඳ මත ජලය සොයා ගැනීම ප්‍රධාන අරමුණක් වනු ඇත. මීට පෙර වෙනත් කිසිම රටක් දක්ෂිණ ධ්‍රැවය ආසන්නයට ගොඩ බැස නැති නිසා ඉන්දියාවේ මෙහෙයුම හඳුනා නොගත් ප්‍රදේශයක් ගවේෂණය කරනු ඇත.

වෙනත් බොහෝ ජාතීන් සහ සමාගම් ද චන්ද්‍ර ජල අයිස්වල මෙම හැකියාව අධ්‍යයනය කිරීම සඳහා දක්ෂිණ ධ්‍රැවයට යාමට අවශ්‍ය වැඩකටයුතු සැලසුම් කරමින් පවතී. එක්සත් ජනපදය, රුසියාව, චීනය, ජපානය සහ ඇමරිකාවේ පෞද්ගලික සමාගම් ඉදිරි වසරවලදී සඳ වෙත මෙහෙයුම් සැලසුම් කරයි. භාවිතයට ගත හැකි ජලය සොයා ගැනීමෙන් අනාගතයේ දී මිනිසුන් සඳ ගවේෂණය කරන ආකාරය සහ භාවිතා කරන ආකාරය පරිවර්තනය කළ හැකි බව ඔවුන්ගේ විශ්වාසයයි.

### ඉන්දියාව සඳ සමාජයට එක්වෙයි

සාර්ථකව චන්ද්‍රයාගේ දක්ෂිණ ධ්‍රැවයට ගොඩබෑමත් සමඟින්, ඉන්දියාව සඳ මතුපිටට ගොඩබෑමේ දුෂ්කර ජයග්‍රහණය අත්කර ගත් ජාතීන් හතරක ප්‍රභූ කණ්ඩායමකට එක්වේ. අනෙකුත් රටවල් වනුයෙ එක්සත් ජනපදය, සෝවියට් සංගමය සහ චීනයයි. එමෙන්ම සඳ තරණය කළ පළමු ආසියාතික රටද ඉන්දියාව ලෙස ඉතිහාස ගත වේ.

මෙම සන්ධිස්ථානයට ළඟාවීම ඉන්දියාවේ වර්ධන හැකියාවන් සහ ප්‍රමුඛ අභ්‍යවකාශ බලවතෙකු ලෙස නැගී එන තත්ත්වය පෙන්නුම් කරන දැවැන්ත ජයග්‍රහණයකි. මෙම සාර්ථකත්වය ද පැමිණෙන්නේ රුසියාවේ Luna-25 අභ්‍යවකාශ යානය එම දක්ෂිණ ධ්‍රැව භූමියට ගොඩබෑමේ උත්සාහයේදී සඳ මතට කඩා වැටී අසාර්ථක වී දින කිහිපයකට පසුවය.

ඉන්දියාවේ අභ්‍යවකාශ වැඩසටහන 1960 ගණන්වල ආරම්භ වූ නමුත් ඉන්දියාව ගෝලීය වශයෙන් විශාල කාර්යභාරයක් ඉටු කිරීමට කැමති අගමැති මෝදි යටතේ වේගවත් විය. සාර්ථක සඳ මෙහෙයුමක් ජාතික අභිමානය සහ තාක්ෂණික බලාගාරයක් ලෙස ඉන්දියාවේ කීර්තිය ඉහළ නංවයි. එය ලබන වසරේ පැවැත්වෙන වැදගත් මැතිවරණවලට පෙර මෝඩිගේ භාරතීය ජනතා පක්ෂයේ ජනප්‍රිය භාවයටද උපකාරී වේ.

### ඉන්දියාවේ අභ්‍යවකාශ මෙහෙයුමේ අනාගතය

චන්ද්‍රයාන්-3 ගොඩබෑම සඳෙහි අඛණ්ඩ ගවේෂණය සඳහා උද්යෝගිමත් බවත් හැකියාවනුත් විවෘත කරයි. ගගන්යාන් මෙහෙයුම හරහා ගගනගාමීන් අභ්‍යවකාශයට යැවීමට ඉන්දියාව මීළඟට උත්සාහ කරන බව **ISRO** සභාපති සෝම්නාත් පැවසීය. එය සාර්ථක වුවහොත් එක්සත් ජනපදය, රුසියාව සහ චීනයට පසුව මිනිසුන් කක්ෂයට යවන සිව්වන රට බවට ඉන්දියාව පත්වනු ඇත.

දිගුකාලීනව, ඉන්දියාව සිය පළමු මිනිසුන් සහිත ගවේෂණය සඳ වෙත යැවීමට ද අපේක්ෂා කරයි. එහි අඩු වියදම් සහ දක්ෂ විද්‍යාඥයින් සමඟින්, ඉන්දියාවේ අභ්‍යවකාශ වැඩසටහන ඉදිරි දශකය තුළ තවත් ප්‍රධාන සන්ධිස්ථාන කරා ළඟා වීමට සූදානමින් සිටී. මෙය රටේ අභ්‍යවකාශ තාක්ෂණය සහ පර්යේෂණ කෘෂිකර්මය, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, ආපදා කළමනාකරණය සහ සන්නිවේදනය වැනි අනෙකුත් ක්ෂේත්‍රවලට ද ප්‍රතිලාභ ලබා දෙනු ඇත.

සාර්ථක චන්ද්‍රයාන්-3 මෙහෙයුම ඉන්දියානුවන් ඉමහත් ආඩම්බරයෙන් හා ප්‍රීතියෙන් පිනවා ඇති අතර. එය විද්‍යාව හා අභ්‍යවකාශ තාක්ෂණය සම්බන්ධයෙන් ඉන්දියාවේ වර්ධනය වන හැකියාවන් සඳහා තවත් ඉදිරි පියවරක් සනිටුහන් කරයි. චන්ද්‍රයාගේ දක්ෂිණ ධ්‍රැවය ගවේෂණය කළ පළමු රට බවට පත්වීමෙන් ඉන්දියාව අධිෂ්ඨානශීලීව සහ කණ්ඩායම් ක්‍රියාකාරකම් තුළින් දියුණු ඉලක්ක කරා ළඟා විය හැකි බව මුලු මහත් මිනිස් සංහතියටම පෙන්වා දී ඇත. අභ්‍යවකාශ ගවේෂනයේ ඉන්දියාවෙ අනාගතය ඉතා දීප්තිමත් වන අතර අසල්වැසි රටක් ලෙස ශ්‍රී ලංකාව ඔවුනට උණුසුම් සුබපැතුම් එක් කරයි.

නිරෝෂන් පෙරේරා

# රැකියා ඉලක්කගත අධ්‍යාපන ක්‍රමයක් ගැන අවධානයක් නැද්ද?

## අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය අරවින්ද කුමාර්




පසුගිය කාලයේ රට තුළ ආර්ථික අර්බුදයක් පැවතියත් අධ්‍යාපන අමාත්‍යාංශයේ කටයුතු පිළිබඳ රජය වැඩි අවධානයක් යොමු කර කටයුතු කළා. ඒ වගේම රටේ දරුවන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතු නඟා සිටුවීම සම්බන්ධයෙන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් වැදගත් තීන්දු තීරණ රැසක් ගත්තා.

රටේ දරුවන්ගේ අධ්‍යාපනය සහ එම ක්ෂේත්‍රයේ සිදු කළ යුතු ප්‍රතිසංස්කරණ පිළිබඳව එතුමා නිරන්තරයෙන් කතා කරනවා. ඒ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව ප්‍රතිසංස්කරණ රැසක් සමඟ එම කටයුතු ඉදිරියට ගෙන යාමට අමාත්‍යාංශය සැලසුම් සහගතව කටයුතු කරනවා.

නව විෂය මාලාවලින් සමන්විත එම අධ්‍යාපන ප්‍රතිසංස්කරණමය වැඩසටහන අධ්‍යාපන අමාත්‍යවරයාගේ මඟ පෙන්වීමෙන් දැනටමත් ක්‍රියාත්මකයි. ස්ටීම් (STEAM) අධ්‍යාපන ක්‍රමය මේ වන විට ලෝකයේ රටවල ඉතා සාර්ථකව ක්‍රියාත්මක වන අධ්‍යාපන ක්‍රමයක්. එම සංකල්පය අපේ රටේ ද ක්‍රියාත්මක කිරීමට රජයේ අවධානය යොමුව තිබෙනවා. ඒ වගේම දරුවන් තාක්ෂණ දැනුමෙන් සන්නද්ධ කිරීමට මෙන්ම නව තාක්ෂණික ක්‍රම ඔස්සේ අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය සැලසුම් සකස් කර තිබෙන බව කිව යුතුයි.

සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විභාග ප්‍රතිඵල ලැබෙන තෙක් නිවෙස්වලට වී සිටින දරුවන්ට වෘත්තීය, තාක්ෂණික මෙන්ම ඉංග්‍රීසි ඇතුළු භාෂා පුහුණුවක් ලබාදීමට අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර තිබෙනවා.මේ සඳහා දිවයිනේ පාසල් 320ක් දැනටමත් තෝරාගෙන තිබෙනවා. එම වෘත්තීය පුහුණු වැඩසටහන ලබන වසරේ ජනවාරි මාසයේ සිට ආරම්භ කිරීමට නියමිතයි.

පාසල් සඳහා ගුරුවරුන් 8,000ක් අප දැනටමත් බඳවා ගෙන තිබෙනවා. ඉදිරියේදී තවත් උපාධිධාරීන් 5,500ක් ගුරුවරුන් ලෙස පුහුණු කර බඳවා ගැනීමට කටයුතු කරනවා. ඊට අමතරව දෙවන භාෂා ගුරුවරුන් ලෙස තවත් 2,500ක් බඳවා ගැනීමට නියමිතව තිබෙනවා. වෘත්තීය පුහුණු වැඩසටහන පසුගිය කාලයේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය නිසා අඩපණ වුණා.

නමුත් මේ වන විට සුපුරුදු ලෙස දිවයින පුරා පිහිටි සියලුම වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සිය කටයුතු ආරම්භ කර තිබෙනවා.

ඒ වගේම 2022 උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල ලබන සැප්තැම්බර් මස 10 වැනිදාට පෙර අනිවාර්යයෙන්ම නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබෙනවා.




# භාණ්ඩාගාරයෙන් ණය අරන් ද තවමත් අමාත්‍යාංශය නඩත්තු කරන්නේ?

## ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය චාමර සම්පත් දසනායක

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය රටට ඩොලර් උපයා දෙන ප්‍රධාන ආයතනවලින් එකක්. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ කටයුතු සම්බන්ධව අපි තීන්දු තීරණ රැසක් ගෙන තිබෙනවා. පසුගිය වසරේ මැණික් අපනයනය කිරීමෙන් ඩොලර් මිලියන 230ක ආදායමක් ලබා ගැනීමට හැකියාව ලැබුණා. එසේම 2023 වසරේ මේ දක්වා මැණික් හා ස්වර්ණාභාරණ ක්ෂේත්‍රයේ අපනයනවලින් ඇමරිකානු ඩොලර් මිලියන 315ක ආදායමක් ලබා ගෙන තිබෙනවා.

පසුගිය කාලයේ මැණික් අපනයනය කිරීමෙන් ලැබුණු ඩොලර් රටට ලැබුණාද කියන ප්‍රශ්නය තිබුණා. එම ගැටලු මගහරවා ගැනීම වෙනුවෙන් නව රජය යටතේ නව රේගු නිෂ්කාශන ක්‍රමවේදයක් සකස් කළා. මේ වන විට අපේ රටින් විදේශ රටකට ගෙන යන සෑම මැණික් ගලකටම ඩොලර් ලැබෙනවාද කියා නිසි සොයා බැලීමක් සිදු වෙනවා. මීට පෙර අපේ මැණික් පිට රටවල වෙන්දේසි වුණාට අපේ රටට ඩොලර් ලැබුණේ නැහැ.

මහ බැංකුවේ වාර්තාවලට අනුව මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අපනයන ආදායම 34%ක වර්ධන වේගයක් ලබා ගෙන තිබෙනවා.

පසුගිය වසරේ අධිකාරියට ලැබී තිබුණේ බලපත්‍ර ලබාදීමෙන් හා තක්සේරු ගාස්තු තුළින් රුපියල් මිලියන 144ක් පමණයි. මෙම වසරේ මේ වන විට පමණක් රුපියල් මිලියන 288ක ලාභයක් අධිකාරිය විසින් ලබාගෙන තිබෙනවා. ඒ නිසා මෙම වසර අවසන් වන විට අධිකාරියට ලැබෙන ලාභය 200%කින් වැඩි කර ගැනීමට සැලසුම් සකස් කර තිබෙනවා.

රටට අවශ්‍ය ඩොලර් සොයා ගැනීමේ වැඩපිළිවෙළ තමයි ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන්නේ. ඒ වගේම අපේ කිසිම ආයතනයක සේවකයෙක් ආණ්ඩුවෙන් වැටුප් ලබා ගන්නේ නැහැ. මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් පමණක් මුදල් අමාත්‍යාංශයට රුපියල් මිලියන 50ත් - 100ත් අතර ප්‍රමාණයක් ලබා දෙනවා.

ඒ වගේම මම පොස්පේට් ආයතනය භාර අරගෙන තවම ගත වුණේ මාස 06ක් වැනි කෙටි කාලයක්. කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් පසුව කර්මාන්ත අමාත්‍යාංශයට යටතේ තමයි පොස්පේට් ආයතනය පැවතියේ. පසුව ජනාධිපතිතුමා එය ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය යටතට පත් කළා. මෙම ආයතනය මම භාර ගන්න විට රුපියල් මිලියන 150ක බැංකු අයිරාවක් තිබුණා. ආයතනයේ සේවකයන්ට වැටුප් ගෙවා ගත නොහැකි තත්ත්වයක් තමයි එහි තිබුණේ. අද එම සියලු ගැටලු විසදා ගැනීමට හැකිවී තිබෙනවා.

වසර 23ක් තිස්සේ රටේ ආන්දෝලනයකට ලක්ව තිබූ පොස්පේට් නඩුව අවසන් කිරීමට ද හැකියාව ලැබී තිබෙනවා. මෙම නඩුව නිසා අපට පොස්පේට් අපනයනය කිරීමට නොහැකි වී තිබුණා. එම නඩුව අවසන්ව සති දෙකක් තුළ පමණක් රුපියල් මිලියන 143ක ලාභයක් උපයා ගෙන තිබෙනවා.

ඒ වගේම බී.සී.සී. සමාගමේ යළිත් පැරණි යන්ත්‍ර සූත්‍ර ප්‍රතිසංස්කරණය කර එහි නිෂ්පාදන කටයුතු සිදු කරනවා. ඒ අනුව ආණ්ඩුවට කිසිදු බරක් නොවන ආකාරයට බී.සී.සී. ආයතනය පවත්වාගෙන යාමට හැකිවී තිබෙනවා. බී.සී.සී. සමාගමෙන් පමණක් අවශ්‍ය නම් මහා භාණ්ඩාගාරයට රුපියල් මිලියන 25ක් පමණ ලබාදීමට හැකියාව ලැබී තිබෙනවා.

ඒ වගේම ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතන තුළින් පමණක් ඩොලර් මිලියන 400ත්-500ත් අතර ප්‍රමාණයක් රටට ලබා ගැනීමේ හැකියාව පවතිනවා.

# පිරිවෙන් ගුරුවරුන්ට විශ්‍රාම වැටුප් අවශ්‍ය නැද්ද?

## පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය විජිත බේරුගොඩ




ගම සහ පන්සල ගහට පොත්ත මෙන් එකට බැඳී පවතිනවා. අපේ රටේ මුරදේවතාවන් ලෙස සලකන උගත්, වියත් මහ සංඝයා වහන්සේ බිහි කළේ පිරිවෙන් අධ්‍යාපනයයි. මහා විහාර අධ්‍යාපන ක්‍රමය මත පදනම්ව ඇරඹුණු පිරිවෙන් අධ්‍යාපනය අපේ රටේ කීර්ති නාමය දෙස් විදෙස්හි පතළ කළ දැවැන්ත අධ්‍යාපන ක්‍රමයක් බව සිහිපත් කිරීමට කැමතියි.

දිවයිනේ දිස්ත්‍රික්ක 25න් 22ක් පුරා විහිදුණු මූලික, මහා, විද්‍යායතන, ද්වි භාෂා සහ සීල මාතා වශයෙන් ප්‍රධාන අංශ 5කින් සමන්විත පිරිවෙන් 822ක ප්‍රමාණයක් පවතිනවා. ඒවා තුළ සාමණේර ස්වාමීන් වහන්සේලා 40,941ක් සහ ගිහි ශිෂ්‍යයන් 36,990ක් අධ්‍යාපනය ලබමින් සිටිනවා, පිරිවෙන් ආචාර්ය මණ්ඩලයේ ගුරුවරුන් 7,591 ක් ද ඇතුළුව සමස්ත කාර්ය මණ්ඩලයේ 8,000කට අධික පිරිසක් සේවය කරනු ලබනවා.

වත්මන් ආර්ථික අර්බුදය හමුවේ වුවද ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා මෙම කාලය තුළ මෙරට අධ්‍යාපනය වෙනුවෙන් සුවිශේෂ කාර්ය භාරයක් ඉටු කළා. ඒ අනුව ගැටලු රැසකට මුහුණ දෙමින් සිටි පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය නැවත සක්‍රීයව ඉදිරියට ගෙන යාමට අපේ අමාත්‍යාංශයට හැකිව ලැබී තිබෙනවා.

පිරිවෙන් ගුරුවරුන්ගේ මාසික වැටුපෙන් 12% මුදලක් විශ්‍රාම වැටුප් සඳහා මාසිකව අය කරගන්නා නමුත් අනෙකු පාසල් ගුරුවරුන් හෝ රජයේ සේවකයින්ගෙන් එවැනි මුදලක් විශ්‍රාම වැටුප සඳහා අය කරගන්නේ නැහැ. අපි මෙම ගැටළුව විසඳීම සඳහා කටයුතු කරමින් සිටිනවා.

නමුත් ඒ සඳහා විශ්‍රාම වැටුප් පනත සහ පිරිවෙන් අධ්‍යාපන පනත යන පනත් දෙකෙහිම පවතින සැලකිය යුතු මට්ටමේ අනනුකූලතාවයන් සංශෝධනය කළ යුතු බවට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් අපට උපදෙස් ලැබී තිබෙනවා. ඒ අනුව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව සහ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති නිර්දේශ අනුව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයත් අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ව ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතිනවා.

වාර්ෂික විසර්ජන පනතෙන් සැලසෙන ප්‍රතිපාදන අනුව සියලුම පිරිවෙන්හි භෞතික, සනීපාරක්ෂක සහ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු ද සිදුකෙරෙමින් පවතිනවා. එම කටයුතු සඳහා බෞද්ධ රටවල තානාපති කාර්යාල සහ ශ්‍රී ලාංකික බෞද්ධ දානපතියන්ගේ ද සහයෝගය ලැබෙමින් පවතිනවා. ඒ අනුව අප පිරිවෙන් අධ්‍යාපනය ශක්තිමත් කිරීමේ අරමුණින් පිරිවෙන් අරමුදලක් පිහිටුවීමේ කටයුතු ද මේ වන විට ආරම්භ කර තිබෙනවා.


සාමාන්‍ය රජයේ පාසල්වල ක්‍රියාත්මක වන ආකාරයටම පිරිවෙන් සඳහා ද අවශ්‍ය සියලු පහසුකම් නොඅඩුව සැපයීමට අමාත්‍යාංශය වශයෙන් අප කටයුතු කර තිබෙනවා.

සටහන
අසන්ත බණ්ඩාර

අත්නොහළ මංගල සිහිනය වෙනුවෙන්...

# වායාම

සුජිත් අක්කරවත්ත



රහස් ශූන්‍යවූ තැන බුද්ධත්වය...
යැයි බුදුන් වදාරා ඇත.
අතීතය තුළ සංස්කෘතික,
ආගමික රහස් සැඟවී ඇත.
අධර්මයෙන් ධර්මය සැඟවී ඇත.
වෛරයෙන් අවෛරය සැඟවී ඇත.
ඒය සදාකාලිකව වසන්කල නොහැකිය.
සනාතන ලෝ දහමට අනුව
කළල් දියේ හැදී වැඩුණු අරවින්දය
දිය මතුපිට පිපෙනු නියතය
එබැවින් අධර්මයෙන් වැසුණු ධර්මයේ
යථා අවබෝධය වෙත,
ප්‍රඥාව වෙත
මිනිසුන් ගෙන යායුතුව ඇත
මේ මංගල වායාම ඒ වෙනුවෙනි...

*තුෂාරා සෙව්වන්දි විතාරණ*
*'ද ලීඩර් සංස්කාරක'*

ඉතිහාසය විසින් නිබඳව දේශපාලනම මොහොත සාපේක්ෂව මුණගස්වයි... බොහෝ ඒකමානීය ඉතිහාස ලෝලීන්ගේ දෘෂ්ටිමය දැක්මට අනුව මංගල සමරවීර මහතා ලංකා ඉතිහාසය නොදන්නෙ යැයි අදහසක් වේ. නමුත් ඔහුට ද වෙනම ඉතිහාස ඉවක් විය. තවදුරටත් ඉතිහාසය හදාරන්න තරම් ශාස්ත්‍ර පිපාසිත ද විය... එම සමය වන විට ඔහුද මානවලින් ඉවත්ව බලමින් සිටියේය.

"වායාම" ද ලීඩර් ප්‍රකාශනයකි.
විමසීම් - *editor@theleader.lk*












පිටකෝට්ටේ, මිෂන් පාර, අංක 19/5/ඒ දරණ ස්ථානයේ පදිංචි කේ.පී.අයි. ප්‍රියංගනී වන මා විසින් උඩහමුල්ල, විජේරාම මාවගේ පිහිටි TDL මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී